OneHope
God's Word. Every Child.



# තාරුණ්‍යයෙ
## ගෝලීය සංස්කෘතිය

ඩිජිටල් තාක්ෂණය හරහා සම්බන්ධිත තාරුණ්‍යයේ දැක්ම

# පටුන

4 හැඳින්වීම

5 ආගමික ආකල්ප හා චර්යාවන්
16 පෞද්ගලික අත්දැකීම් හා දුෂ්කරතාවයන්
25 ඩිජිටල් තාක්ෂණය හරහා සම්බන්ධතා ගොඩනැගීම හා එහි බලපෑම
32 අනන්‍යයතාවය හා මානව සබඳතා
42 අනුබලය හා මඟපෙන්වීමේ හඬ

50 රොබ් හොස්කින්ස්ගේ ලිපිය
51 වන් හෝප් හඳුනා ගනිමු
51 ක්‍රමවේදය
52 දත්ත එකතුව
53 අර්ථ දැක්වීම

# හැඳින්වීම

මේ වන විට ගෝලීය ජනගහනයෙන් 11%ක් යෞවනවියේ පසු වෙති[1]. ලෝක ජනගහනයෙන් සෑම 10 දෙනෙකුගෙන්1ක් අයෙකු යෞවනත්වයේ සිට වැඩිහිටි භාවයට පරිවර්තනය වේග 10 දෙනා අතරින් යෞවනත්වය පසු කරන මෙම එක් තැනැත්තා, සමාජ බලපෑම් වලට මුහුණ දෙමින්, අත්හදා බැලීම් සිදු කරමින් ක්‍රමයෙන් තමාගේ අනාගතයට මුහුණ දීමට යොමුවේ.

නව යෞවනවිය තරමක් අසීරු කාල සීමාවකි. විශේෂයෙන්ම මෙම වයස් සීමාව තුළ ඔවුන්ගේ ඇදහිල්ලේ ගමන සැලකිල්ලට ගත යුතුය. මෙය අවබෝධ කර ගැනීම සඳහා වයස අවුරුදු 13-19 අතර ලෝකයේ විවිධ රට වල නව යෞවුන් අය අතර මාර්ග ගත සමීක්ෂණය කරන ලදි.

1 United Nations Population Division, Total Population Database, https://population.un.org/wpp/DataQuery/ Accessed August 2020.

රටවල් 20

භාෂා 14

ඩිජිටල් තාක්ෂණය හරහා සම්බන්ධිත යෞවනයන් 8,394

වයස් කාණ්ඩය 13-19

සමීක්ෂණ කරුණු 70ක්



**අප්‍රිකාව:** කෙන්යාව, නයිජීරියාව, දකුණු අප්‍රිකාව (සමීක්ෂණයට සහභාගිවූ යෞවනයන් ගණන 1,275)

**ආසියාව:** චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, වියට්නාමය (සමීක්ෂණයට සහභාගිවූ යෞවනයන් ගණන 2,100)

**යුරෝසියාව:** ඊජිප්තුව, නෙදර්ලන්තය, පෘතුගාලය, රුමේනියාව, රුසියාව, ස්පාඤ්ඤය, බ්‍රිතාන්‍යය (සමීක්ෂණයට සහභාගිවූ යෞවනයන් ගණන 2,936)

**ලතින් ඇමරිකාව:** ආර්ජන්ටිනාව, බ්‍රසීලය, කොලොම්බියාව, මෙක්සිකෝව (සමීක්ෂණයට සහභාගිවූ යෞවනයන් ගණන 1,673)

**උතුරු ඇමරිකාව:** එක්සත් ජනපදය (සමීක්ෂණයට සහභාගිවූ යෞවනයන් ගණන 410)

# සහභාගීවූ නව යෞවනයන් පිළිබඳ තොරතුරු


පිරිමි 51%
ගැහැණු 49%

වයස් කාණ්ඩ

| 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 |
|---|---|---|---|---|---|---|
| 5% | 4% | 6% | 13% | 15% | 27% | 30% |

අනෙකුත් ආගම් 23%

- ඉස්ලාම් 12%
- බෞද්ධ 5%
- හින්දු 4%



ක්‍රිස්තියානි 43%

ආගමක් නොමැත 34%

- අදේවවාදී 15%
- කිසිවක් නැති 13%
- ඇග්නොස්ටික් 5%

ඔවුන්ගේ පිළිතුරු බොහෝ දුරට දැන් මෙන්ම සංකීර්ණය. අපට ලැබුන ප්‍රතිචාර කියවීමේදී අපව සංකීර්ණ මෙන්ම විවිධාකාර හැගීම් ජනිත කරවන මානසික ස්භාවයකට අපව පත් කෙරින. ඔවුන්ගෙන් පිරිසක් කෙදිනකවත් බයිබලය කියවා හෝ දේව මෙහෙයකට සහභාගිවී නොමැති වීම අපව පුදුමයට පත්කරවීය. බොහෝ දෙනෙකුට යහපත් පවුල් පසුබිමක් තිබීම සතුටු විය හැකි කාරණයක් නමුත්, අප සිතනවාට වඩා මානසික සෞඛ්‍යය ගැටලු, ගෝලීයව පවතින බව දැනගැනීම හදවත කැඩීයන තරමේ කණගාටුදායක කාරණයකි. තම අනන්‍යතාවය පිළිබඳව ගැඹුරු ව්‍යාකූලත්වයක් දැකිය හැකිය. තවත් බලාපොරොත්තු සුන්වූ පුද්ගල කණ්ඩායම් වෙතට ඔවුන් අවවාද අනුශාසනා ගැනීමට පෙළඹී තිබීම පුදුම සහගතය. ඒ තුළින් එම පුද්ගලයන්ගේ නොයෙකුත් විශ්වාස හා ආකල්ප සමග බද්ධ වීමට ඔවුන්ට සිදුවිය හැක.

අවධානයට ගන්න .... මෙම වාර්තාව අධ්‍යයනය සිත් ගන්නා සුලු එකක් නොවිය හැක! නමුත් අවසානය තෙක් අධ්‍යයනය කළ හැකි නම්, මෙහි එළිදරව් කිරීම් ඔබට අතිශය වැදගත් වේ. නව යෞවුන් වියේ කෙනෙකුට වර්ධනය වීමට මඟපෙන්වීමද පහසු කාර්යයක් නොවේ. එය සමහර කාල වලදී සංකීර්ණ, දැඩි, සහ බලාපොරොත්තු රහිත බව පෙනී යයි. නමුත් ඔවුන්ගේ සිතුවිලි අවබෝධ කරගත හැකි නම්, ඔවුන්ගේ මෙම අභියෝගමත් නමුත් යහපත් වර්ධනයක් කළ හැකිය ... මෙම කාල පරිච්ඡේදයේදී ඔවුන්ට ආරක්ෂිතව මගපෙන්වීමට හා උදව් කිරීමට ඔබට හැකි වේ.

# ආගමික ආකල්ප හා චර්යාවන්

# අප සොයා ගත් කරුණු

## ගෝලීය නව යෞවනත්වය...

**ගෝලීය යෞවනනයන්ගෙන්** අඩකට වැඩි (52%) **ඔවුන් විසින්ම කිසිදු දිනක කිසිම ආගමික ලියවිල්ලක් කියවා නොමැති බවයි.**

දේවස්ථානයකට නොයන්නාවූ යෞවනයන් පවසන්නේ **ඔවුන්ට කව්රුන් හෝ ආරාධනා කරන්නේ නම්** ඔවුන් එයට සහභාගි වන බවත්, ඔවුන් දන්නා කිතුනුවන් **කාරුණික හා සැලකිලිමත්** පිරිසක් බවත්ය.

ගෝලිය නව යෞවනයන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් (52%) විශ්වාස කරන්නේ **සෑම ආගමික ඉගැන්වීමක්ම එක හා සමාන සත්‍යයතාවයකින් යුක්ත වන බවයි.** සමහර කිතුනුවන්ද මෙම මතයේ සිටුනු දැකිය හැක.

අතපසු නොකර මෙය කියවන්න.

ගෝලිය නව යෞවනයන්ගෙන් **තුනෙන් දෙකක්** පමණ පිරිසක් පවසන්නේ, ඇදහිලි විශ්වාසයන් හෝ ආධ්‍යාත්මික ගමන **ඔවුන්ගේ අනන්‍යයතාවයේ වැදගත් කොටසක් බවයි.**

අනෙකුත් ආගම් අදහන යෞවනයන් සමඟ බැලීමේදී, ඉස්ලාම් ආගම අදහන යෞවනයන් ඔවුන්ගේ **ආගමික දේවමෙහෙයන්ට සහභාගී වීමේදී, හා ආගමික ලියකියවිලි අධ්‍යයනය කිරීමේදී, යාච්ඤා කිරීමේදී, වඩා විනය ගරුක** ආකාරයෙන් කටයුතු කරයි.



## ක්‍රිස්තියානි යෞවනත්වයේ...

සමීක්ෂණයට ලක් වූ නව යෞවනයන්ගෙන් **43%ක් කිතුනුවන් ලෙස තමා විසින්ම හඳුනාගෙන ඇත.**



**කැපවූ කිතුනුවෙකුගේ** තම ඇදහිල්ල පිළිබඳ භාහිර ක්‍රියාකාරකම් පෙන්නුම් කරන්නේ **7%** ක් පමණි. *(6 නව පිටුවේ අර්ථ දැක්වීම බලන්න)*

තමාව ස්වයං හඳුනා ගැනීමක් කළ ක්‍රිස්තියානි නව යෞවනයන්ගෙන් **40%ක් පවසන්නේ ඔවුන් කිසිදු දිනක බයිබලය කියවා නොමැති බවයි.**

ක්‍රිස්තියානි ධර්මයේ මූලික විශ්වාසයන් පිළිපදින, දිනපතා බයිබලය සමඟ සම්බන්ධ වන හා යාච්ඤා කිරීමේ පුරුද්දක් ඇති නව යෞවනයන්ගේ **පෞද්ගලික ජීවිතයේ ගැටළු වල සැලකිය යුතු අඩුවක් දැකිය හැකිය.**

# සත්‍යතාවය නම් . . .

අදටත් ගෝලීය නව යෞවනයන්ගෙන් ආගමික විශ්වාසයන් පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබා ගැනීම දුෂ්කර කාර්යයක් වී ඇත්තේ, එක් ආගමකින් පමණක් සත්‍ය සොයාගත හැකි බව ප්‍රකාශ කිරීමට ඔවුන් අකමැත්තක් දැක්වීම නිසාය.

ගෝලීය වශයෙන් නව යෞවනයන්ගෙන් අඩකට වඩා (52%) විශ්වාස කරනුයේ සියලු ආගමික ඉගැන්වීම් සමාන සත්‍යතාවයකින් සහ වටිනාකමකින් යුක්ත වන බවයි. කිතුනු යෞවනයන්ද අන්‍ය ආගමිකයන් මෙන්ම එම මතයම දරයි. ඉස්ලාම්, බෞද්ධ, සහ හින්දු වැනි අනෙකුත් ආගමික විශ්වාසයන් මත සිටින යෞවනයන්ද මීටත් වඩා වැඩි වශයෙන් - එනම් 67% එම මතයේම සිටියි.

මෙය පැටලිලි සහගතද? ඔව්, නමුත් මතකයේ තබාගන්න ඔවුන් යමක් තේරුම් ගන්නට උත්සහ දරන්නාවූ යෞවන වයසේ පසුවන්නන්ය. ඔවුන්ගේ පිවිතයේ ආධ්‍යාත්මික ගමන වැදගත් ස්ථානයක් ගන්නා බව ඔවුන් පැවසුවත්, ආත්මික සත්‍යතාවය හඳුනාගත හැක්කේ කෙසේද යන සුවිශේෂී දැක්ම ඔවුන් ප්‍රතික්ෂේප කරයි.

සත්‍යය සඳහා ඔවුන්ගේ කැපවීම නොමැතිකමට වඩා අවුල් සහගත වන්නේ ඔවුන් එය සොයන බවක් නොපෙනීමත් එය බෙදා ගැනීම අඩු වීමයි. යෞවනයන්ගෙන් අඩකට අසන්න ප්‍රමාණයක් (46%) ඇදහිල්ල සම්බන්ධ කරුණු බෙදා නොගන්නා පිරිස් සමඟ තමන්ගේ ඇදහිල්ලේ ගැටළු බෙදා නොගෙනියි.

**කිතුනු යෞවනයන් පවා මෙම චින්තනයට බලපෑම් කරන බව පෙනී යයි. පව් කමා කිරීම කළ හැක්කේ ක්‍රිස්තුස් වහන්සේ මත තිබෙන ඇදහිල්ල තුලින් පමණක් බව යන ප්‍රකාශයට එකඟ නොවන්නේ ඉතා සුළු පිරිසකි (30%).**


## ඇදහිල්ල බෙදා ගැනීම

*යෞවනයන් තම විශ්වාසයන් බෙදා නොගන්නාවූ මනුෂයන් සමඟ ආගමික සහ ආධ්‍යාත්මික දේ පිළිබඳව කොපමණ වාරයක් කතා කරනවාද? (මාසිකව හෝ බොහෝ විට-ග*

| සියලු නව යෞවනයන් | ක්‍රිස්තියානි | ඉස්ලාම් | අනෙකුත් ආගම් |
|---|---|---|---|
| 28% | 32% | 46% | 35% |


යථාර්ථය නම් **ක්‍රිස්තියානි යෞවනයන්ගෙන් 44%ක් තම වගකීමක් ලෙස ඔවුන්ගේ ඇදහිල්ල අන් අය සමඟ බෙදා ගැනීමට එකඟතාවය නොදක්වයි.**

## ගෝලීය ආගමික අනන්‍යයතාවය




ගෝලීය වශයෙන් **යෞවනයන්ගෙන් 5 දෙදෙනෙකුගෙන් 2ක් පමණ තම අනන්‍යයතාවය ක්‍රිස්තියානි වශයෙන්ද,** 4න් 1ක් අන්‍ය ආගමිකයන් වශයෙන්ද, 3න් 1ක් කිසිදු ආගමික සම්බන්ධතාවයක් නොමැති පිරිස් වශයෙන්ද, ඔවුන්ගේ අනන්‍යයතාවය හඳුනා ගෙන ඇත. තවද අප සියලු කළාපයන්හි කල අධ්‍යයනයන්ට අනුව වැඩි කිතුනුවන් ප්‍රමාණයක් සිටින්නේ අප්‍රිකාවේ වන අතර, අවම කිතුනුවන් ප්‍රමාණයක් සිටින්නේ ආසියාවේය.

## කළාපීය වශයෙන් ආගම්



# කැපවූ ස්වල්ප දෙනෙක්

ක්‍රිස්තුස් වහන්සේ සමඟ ගැඹුරින් ගමන් කරන්නාවූ කිතුනු යෞවනයන් එක් එක් පුද්ගලයා අනුව සළකා බැලීමේදී, ඔවුන්ගේ වටපිටාව, ඔවුන්ගේ සංස්කෘතික පසුබිම අනුව විශාල වශයෙන් වෙනස්කම් දැකිය හැක. One Hope ආයතනය නිර්වචනය කරන ආකාරයට අනුව කැප වූ කිතුනුවෙකු යනු කිතුනු විශ්වාස සහ චර්යාවන් පිළිබඳ වගඋත්තරකරුවෙකි.

## කැපවූ කිතුනු යෞවනයන්ගේ විශේෂ ගුණාංග 6 ක්




- දෙවියන් වහන්සේ තමා තුල ජීවත් වන බව හා උන් වහන්සේ සමඟ පෞද්ගලික සම්බන්ධතාවයක් ඇති කරගත හැකි බව ඔවුන් විශ්වාස කරයි.
- අවම වශයෙන් සතියකට වරක්වත් යාච්ඤා කරයි
- අවම වශයෙන් සතියකට එක් වතාවක්වත් ඔවුන් විසින්ම තනිවම දේව වචනය කියවීම.
- යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව විශ්වාස කිරීම.
- ක්‍රිස්තුස් වහන්සේව අදහ ගැනීමෙන් පමණක් පාපයට කමාව ලැබෙන බව විශ්වාස කරයි
- ශුද්ධ බයිබලය දෙවියන් වහන්සේගේ වචනය බව විශ්වාස කරයි

**මෙම යෞවනයන් යෙහෝවා සාක්ෂිකාරයන් හෝ මෝර්මන් නොවන අතර, කිතුනුවන් ලෙස තම අනන්‍යයතාවය තහවුරු කරගෙන තිබෙන අය වේ. කැපවූ කිතුනුවන් කතෝලිකල සෙවන්ත් ඩේ ඇඩ්වෙන්ටිස්ට්, ඕතඩොක්ස් හෝ වෙනත් නිකායන් ගණනාවක් විය හැකිය.*

ගෝලීය වශයෙන්, කැපවූ කිතුනු නව යෞවනයන් සිටින්නේ ඉතා ස්වල්පයකි. 43% ක් පමණ කිතු දහම ඔවුන්ගේ ආගම ලෙස ප්‍රකාශ කළද, කිතුනු ගමන සඳහා කැපවී සිටින බවට පෙන්නුම් කරන විශ්වාසයන් සහ කිතුණු චරිත ගුණාංග පෙන්නුම් කරන්නේ ඉන් 7% ක් පමණි.

***නාමික කිතුනුවන්** යනු තමන්ව කිතුණුවන් ලෙස හඳුන්වා ගන්නා නමුත්, ඉහත නිර්වචනය කර ඇති කැපවූ කිතුනුවෙකු තුල තිබිය යුතු මූලික විශ්වාසයන් හෝ කිතුණු චරිත ගුණාංග, තමන් තුළ පෙන්නුම් නොකරන යෞවනයන්ය.*


## ක්‍රිස්තියානි ආගම අනුව කැපවී සිටින කිතුනුවන්.




**ලෝකය පුරා සිටින යෞවනයන් 14 කින් 1ක කට වඩා අඩු ප්‍රමාණයක් ශක්තිමත්ව කිතුනු විශ්වාසයන් හා කිතුණු චරිත ගුණාංග අනුව ජීවත් වේ.**

නව යෞවන යෞවනියන්ට වඩා වැඩිහිටි යෞවනයන් කැප වූ කිතුණුවන් වීමට වැඩි ඉඩක් ඇත.

## වයස් සීමා අනුව කැපවී ඇති කිතුනුවන්




## කැපවීම මඟින් ඇති වන ප්‍රතිලාභ

කැපවූ කිතුනුවෙකු වීමේ ධනාත්මක ප්‍රතිලාභ ප්‍රතික්ෂේප කළ නොහැකියග උදාහරණ කිහිපයක් පහත දක්වා ඇත.


- මෑත කාලය තුල කැපවූ කිතුනු යෞවනයන්ගේ මානසික අවපීඩනය අනෙකුත් යෞවනයන්ට වඩා අඩුය (35%-46%).
- සියදිවි නසා ගැනීමට උත්සහ කරනු ලැබූ බවට වාර්තා වන්නේ ඔවුන්ගෙනුත් භාගයකට වඩා අඩු ප්‍රමාණයකි (3%-7%).
- ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය පිළිබඳව වියාකුල තත්වයකින් පවතින්නේ ඔවුන්ගෙන් අඩු ප්‍රමාණයකි (6%-11%).
- ගෝලීය වශයෙන් අනෙකුත් යෞවනයන් සමඟ සසඳන විට සමලිංගික ආකර්ෂණයට පෙළඹී තිබෙන්නේ ඔවුන්ගෙන් අඩක් වැනි ප්‍රමාණයකි (12%-21%).

අප කරනු ලැබූ සියලු ආකාර සමීක්ෂණයන්ට අනුව මානසික සෞඛ්‍යය ගැටලු හා අවදානම් චර්යාවන්, කැප වූ කිතුනුවන්ගෙන් වාර්තා වන්නේ ඉතා අඩු ප්‍රමාණයකි.

# පෞද්ගලික දුෂ්කරතාවයන්

*පසුගිය මාස තුනෙහි මම අත්දැක ඇත්තෙමි:*


සියලු යෞවනයන් | නාමික කිතුනුවන් | කැපවූ කිතුනුවන්




# ආගමික චර්යාවන්

නාමික කිතුනු යෞවනයන්ට වඩා කැපවූ කිතුනු යෞවනයන් කැපී පෙනෙන වෙනත් ආකාරයේ ආගමික චර්යාවන් පෙන්නුම් කරන බව ඔබට මෙහිදී දැකගත හැක:

නාමික කිතුනුවන් | කැපවූ කිතුනුවන්



# ආගමික පුරුදු

## ශුද්ධ ලියවිල්ල හා සම්බන්ධතාවය



**යෞවනයන්ගෙන් 52%ක් කිසිදු දිනක තමන් විසින්ම ශුද්ධ ලියවිල්ල කියවා නැත.**

**ගෝලීය යෞවනයන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් (52%) පවසන්නේ ඔවුන් කිසිදු දිනක ශුද්ධ ලියවිල්ල තමන් විසින්ම කියව නොමැති බවයි.**

කිතුනුවෙකු ලෙස තම අනන්‍යතාවය පිළිගෙන තිබෙන යෞවනයන්ගෙන් 40% පවසන්නේ ඔවුන් කිසිදු දිනක බයිබලය කියවා නොමැති බැවයි.

කිතුනු යෞවනයන්ගෙන් ශුද්ධ බයිබලය කියවන ප්‍රමාණයට (11%) වඩා 3න් ගුණයක් ඉස්ලාම් යෞවනයන් දිනපතා කුරානය කියවීමේ නියැලෙති (36%)





% කිසිදා කියවා නොමැති බව පවසන පිරිස්

## දේවස්ථානයට සහභාගී වීම


- සතිපතා හෝ ඊට වැඩි
- මාසිකව
- වසරකට කිහිප වතාවක් හෝ ඊට අඩු

**අප්‍රිකාව**




57% 10% 33%

**ආසියාව**




26% 7% 67%

**යුරෝපියාව**




17% 7% 76%

**ලතින් ඇමරිකාව**



21% 10% 69%

**උතුරු ඇමරිකාව**



26% 8% 67%

යෞවනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් පවසා සිටින්නේ ඔවුන් අනෙකුත් ආගමික පුරුදු වලට වඩා යාච්ඤා කිරීමට පුරුදු වී සිටින බවයි.


ආගමක් පිළිබඳ උනන්දුවක් නොමැති යෞවනයන්ගෙන් 42%කියා සිටින්නේ ඔවුන් දිනපතා හෝ සතිපතා යාච්ඤා කරන බවයි. මේ පිළිබඳ සම්පූර්ණ සටහනක් පහත පිටුවලින් දැකගත හැක.


41% කිතුනු යෞවනයන් සහ 33% අනෙකුත් ආගමික යෞවනයන් සමඟ සසඳන කල මුස්ලිම් යෞවනයන් 72%ක් දිනපතා යාච්ඤා කරන බව වාර්තා වේ.

ආත්මික දේ සමග බැඳුනු පිවිතයක් ගත කිරීම ආගමික පුරුදු ක්‍රියාවට නැංවීමට වඩා විශාල වෙනසක් ඇත ඔබ නමස්කාර කිරීමට යන්නාවූ ස්ථානය සහ ඔබ ශුද්ධ ලියවිල්ලේ අන්තර්ගත කරුණු සමග නියැලී සිටින ආකාරය යෞවනයන්ගේ සජීවී අත්දැකීම් සහ පුද්ගලික අරගල වලට බොහෝ දුරට බලපෑමක් ඇති කරයි.


# ගෝලීය යෞවනයන්ගේ ආගමික පුරුදු

අප සංගණනය කල ආකාරයට යවනයන්ගේ ආගමික පුරුදු නම්, තම ඇදහිලිවන්ත ප්‍රජාව සමග සහභාගිකම් පැවැත්වීම, ශුද්ධ ලියවිල්ල කියවීම, යාච්ඤා කිරීම ආදිය වේ ණසියලු ආගම් සම්බන්ධයෙන් අපගේ අධ්‍යයනයන්ට අනුව ආත්මිකතලයේ ක්‍රියාවන් වඩාත් විනයකරුකව විදහා දක්වන්නේ මුස්ලිම් තරුණයන්ය.




# අත්මිකත්වය අනන්‍යතාවයක් ලෙස



දැනට දේවස්ථානයකට සහභාගි නොවන යෞවනයන්ගෙන් 41% පවසන්නේ ඔවුන්ට ඇරයුමක් ලැබුනහොත් ඔවුන් පැමිණෙන බවයි.

34%ක් පවසන්නේ ඔවුන්ට විශ්වාසයක් නොමැති බවයි.

මම කිසිදු කිතුනුවෙකු නොදන්නෙමි




**පුදුමය නම්, ලොව වටා සිටින යවනයන් ඔවුන්ගේ ආගමික සම්බන්ධතා නොසලකා හරිමින් ආත්මික තලයේ දේවල් පිළිබදව සොයමින් සිටිමියි.**


ගෝලීය යෞවනයන්ගෙන් 3 න් 2 ක් පවසන්නේ ඔවුන්ගේ ඇදහිලි විශ්වාසයන් හෝ ආත්මික ගමන ඔවුන්ගේ අනන්‍යතාවයේ වැදගත් කොටසක් වන බවයි ඍසැලකිය යුතු කාරණය නම් කිසිදු ආගමක් නොමැති යෞවනයන්ගේන් අඩකට අසන්න ප්‍රමාණයක්(44%) තවමක් මේ දෙයම පැවසීමයි.

දේවස්ථානයට සහභාගි නොවන යෞවනයන්ගෙන් 41%ක් පවසන්නේ ඔවුන්ට ඇරයුමක් ලැබුනහොත් ඔවුන් දේවස්ථානයට පැමිණෙන බවයි ඍ4 දෙනෙකුගෙන් 1 අයෙක් පමණක් සහභාගිත්වය ප්‍රතික්ෂේප කරයි.

**තවත් වැදගත් පුවතක්: යෞවනයන්ට ඔවුන්ගේ ජිවිත වල සිටින ඇදහිලිවන්තයන් පිළිබද ධනාත්මක දැක්මක් තිබේ.**

කිතුනු නොවන්නාවූ යෞවනයන්ගෙන් 71%ක් පවසා තිබෙන්නේ ඔවුන් දන්නාවූ බොහෝ කිතුනුවන් කරුණාවන්ත හා සැලකිළි බවින් යුක්ත බැව් ඍකෙසේනමුත් සමහර ආසියානු රටවල සැලකියයුතු යෞවනයන් සන්කයාවක් පවසා තිබෙන්නේ ඔවුන් කොහෙත්ම කිතුනුවන් නොදන්නා බවයි.

## යෞවනයන්ට දේවස්ථානයට සහභාගි විය හැකිද



# නිගමනය

මතක තබා ගන්න මෙය ජයාරුඋපයක් පමණක් නොවන බව සුභාරංචිය නම් මෙහි නිරූප-නය කර ඇති යවනයන්ගේ ආකල්ප හා පුරුදු නියම තත්වයට වඩා බොහෝ දුරින් පැවතීමය ඔවුන්ගේ වයස් අනුව ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමට හා අදාළ කර ගැනීමට ඔවුනට උදව් කල හැක්කේ සහ මගපෙන්විය හැක්කේ කෙසේද යන්න මෙම සමීක්ෂණය මගින් අපට වටිනා සුක්ෂම දැක්මක් සහ කරුණු ලබාදේ.

- **මෙය ඇසීම දුකට කාරණයක් නොවේ!**
  සමස්ත යෞවන වයසේ පසු වන්නන් ගත කල ඔවුන් ආත්මිකව විවුර්තව සිටින අතර ඔබ සිතනවාට වඩා නොහැදිලි වන්තයන් දේවස්ථානයට යන්නට කැමැත්තක් දක්කවයි ඔවුන්ට කිතුනුවන්ගේ කරුණාව සහ රැකවරණය පිළිබඳ ධනාත්මක අවබෝධ ය ක් ඇත ඔබ ඔවුන්ගේ සද කල ඉරණම පිළිබඳ සැලකිලිමත් බව, ඔබගේ අනන්‍යතාවයේ වැදගත් කොටසක් වන ආත්මික ගමන පිළිබඳ බෙදා ගැනීම බිය නොවන බව ඔවුනට පෙන්වන්න.

- **නිවැරදි දේ පමණක් ප්‍රමාණාත්මක නොවන බව සැහැල්ලුවෙන් විශ්වාස කරන්නග**
  හරවත් කිතුනු විශ්වාසයන්ගෙන් යුත් සහ පුරුද්දක් වශයෙන් ශුද්ධ ලියවිල්ල සමග සම්බන්ධතාවක් සහ යාච්නාවෙන් යුතු යවනයන්ගේ ජිවිත වල විශාල වෙනසක් දැකිය හැක දේව වචනය හා යාච්නවා තුලින් නාමික කිතුනු භාවයෙන් කැපවූ කිතුනු භාවයට ඔවුන් හැඩගැස්වීමට, දිරීමත් කිරීමට උදව් කිරීම අතිශය වැදගත් වේ මෙම ශේෂ්රයන් දෙක තුලින් ඔවුන් ගොලත්වයට යොමු කිරීමෙන් ඔවුන්ගේ ජිවිත වල තිබෙන අනෙකුත් දේවල් වල බිද වැටීමක් දැකිය හැක

- **ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීම යනු අනන්‍යතාව හා ගෝලත්වය යන දෙකම වේග**
  යවනයන් ඇදහිල්ල වැදගත් බවට එකග වීමට ඉක්මන් විය හැකි අතර සෑම ඇදහිල්ලකටම ගැලවීමේ බලයක් නොමැත පාපයට සමාව දිය හැක්කේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඇදහීමෙන් පමණක් වන බවට වන පරම සත්‍යතාවය මත කිතුනු යවනයන් සිට ගැනීමට අවශ්‍ය වේ මෙය සුභාරංචියේ හදවත වන අතර සෑම තරුණයෙකුම තමන් විසින්ම මෙය අසා විශ්වාස කල යුතුයගග




# පෞද්ගලික අත්දැකීම් හා දුෂ්කරතාවයන්


# අප සොයාගත් දේ

සැලකිය යුතු යවනයන් ප්‍රමාණයක් ඔවුන්ගේ මානසික සෞඛක්‍ය, අධික සංකාව, ආතතිය සහ සිව්දිවි හානි කර ගැනීමේ ආකල්ප හා උත්සහකිරීම් වලට යොමු වීම ආදී අරගලයන් සමග පොරබදිග



පසුගිය මස 3න තුළ ගෝලීය වශයෙන් යෞවනයන් **4න් 1** අයෙකුට සියදිවි හානි කර ගැනීමේ අදහස් ඇති වී තිබෙන බව වාර්තා වී ඇත.




**14 දෙනෙකුගෙන් 1** කෙනෙකු සත්‍ය වශයෙන්ම තමන්ගේ ජීවිතය නැති කර ගැනීමට **උත්සහ කර තිබෙන බව පවසයි.**

ඔවුන්ගේ මානසික ගැටළු සලකා බැලීමේදී පිරිමි ළමුන් මෙන් **දෙගුණයක් ගැහැණු ළමුන්** දැඩි ලෙස පිඩාවට පත්වන බවත් දෙගුණයකට සමාන ප්‍රමාණයක් පවසන්නේ **ඔවුන් සියදිවි හානි කරගැනීමට උත්සහ කිරීමට පෙලබුනු බවයි.**



### ගෝලීය යෞවනයන්




ගෝලීය යෞවනයන්ගෙන් **10 දෙනෙකුගෙන් 3** දෙනෙකු පසුගිය මස 3 තුළ ලිංගික ක්‍රියාකාරකම් වල නිරතව ඇති බව වාර්තා වේ.

### කිතුනුවන්



මෙම ප්‍රමාණය **කිතුනුවන් අතර ඊටත් වඩා ඉහළ** මට්ටමක පවතී (3ට 1ක්)

*සටහන: මෙහි පිළිබිබු වන්නේ අවිවාහක යෞවනයන්ය*



පසුගිය මස 3න තුළ යවනයන් **5න් 1 කට** සමලිංගික ආකර්ෂණය පිළිබද හැගීම් ඇති වී තිබෙන බවට වාර්තා වී තිබේ.

# යෞවනයන්ගේ යථාර්තය දෙස බැලීම

මෙම අධ්‍යනය තුල සිටින්නාවූ යවනයන් අපට කල්තිය කියා සිටියේ ඔවුන් බරපතල පෞද්ගලික ගැටළු සමග ගනුදෙනු කරමින් සිටින බවත්, අද ලෝකයේ ජිවත් වන යවනයන් වශයෙන් සංකීර්ණ වු යථාර්තය පිළිබද බෙදා ගනිමින් සිටින බවයි ඹ්එය අපහසු දෙයක් වුවත් අපට කල හැක්කේ ඔවුන්ගේ ඇස් වලින් පෙනෙන පිවිතය අපගේ දැක්මෙන් තේරුම් ගෙන උදව් කිරීමෙන් පමණි.


## මානසික සෞඛ්‍ය පිළිබද සානුකම්පිතව බැලීම.

කොරෝනා වසංගතයට පෙරද, තනිකම, සංකාව, මානසික අවපීඩනය, සියදිවි හානි කර ගැනීම්, ලිංගික ක්‍රියාකාරකම් වල නිරත වීම, - සමලිංගික ආකර්ෂණය ආදී අරගලයන් සමගින් ගමන් කරන්නාවූ යෞවනයන්ගේ කැපී පෙනෙන අනුපාතයක් වාර්තා වී ඇත. - විශේෂයෙන් ගැහැණු ළමුන් අතර.

පෞද්ගලික මට්ටමින් ගැබුරට විහිදුනු මානසික සෞඛ්‍යයෙන් සිටින්නාවූ යෞවනයන්ගේ දැක්ම සහ දැනීම ආපසු හැරවීමට මෙය කවුළුවක් වී තිබේ.


*කරුණාවෙන් සලකන්න: මානසික අවපීඩනය සහ සාංකාව අදිය සායනික මට්ටමේ අවශ්‍යතා නොවේ. මන්ද ඔවුන් විසින්ම එම අත්දැකීම් ලබා ඇති බව ඔවුන්ට දනුනේනම් එම කරුණු ඔවුන් විසින්ම සපයයි.*

## අරගලයන්ට මුහුණ දෙන්නාවූ ප්‍රධාන රටවල්




### ගෝලීය මානසික සෞඛ්‍ය

පසුගිය මස 3න තුළ මම අද්දැකීම් ලබා තිබෙනවා



**රටවල් 4ක යෞවනයන්ගෙන් සියදිවි හානි කරගැනීමේ, සිතීමේ අනුපාතය 3ට 1 කට වඩා වැඩි බව වාර්තා වනවාත් සමගම එය ගෝලීය වශයෙන් 4න් 1ක් ලෙස වාර්තා වේ.**


පසුගිය මස 3න තුළ රටවල් 4ක යෞවනයන් සියදිවි හානි කර ගැනීමට උත්සහ කිරීමේ අනුපාතය 10ට 1කකට වැඩ වැඩි බව වාර්තා වන අතර එය ගෝලීය වශයෙන් 7%ක් (14 ට 1 ක්) බව වාර්තා වේ.


අපගේ අධ්‍යනයන්ට අනුව සියදිවි හානි කර ගැනීමේ වයස් වල ප්‍රවණතාවයන්ට අනුව නිරීක්ෂණය කර ඇති අතර එය වැඩිහිටි යෞවනයන්ට වඩා නව යෞවනයන් තුල ඉතා ඉහළ මට්ටමක පවතී.

*කරුණාකර සටහන් කර ගන්න: මෙම දත්ත යෞවනයන් විසින් වාර්තා කරන ලද දත්ත වන අතර ඒවා රෝහල් හෝ වෙනත් රටවල් තුල වන්නාවූ මෙම මාතෘකාවට සම්බන්ධ වෙනත් සමීක්ෂණයන් පදනම් කරගත් සිදුවීම් තුලින් ලබාගත් දත්ත නොවන මතක තබා ගැනීම වැදගත් වේ.*


ගෝලීය යෞවනයන්ගෙන් 4න් 1ක් සියදිවි හානි කරගැනීමේ සිතුවිලි තුලින් පසු වන බව වාර්තා වේ.

## අරගලයන්ට මුහුණ දෙන්නාවූ ප්‍රධාන රටවල්





## වයස් සිමාවන්ට අනුව සියදිවි හානි කරගැනීමට උත්සහකිරීම්



# අඳුරු ස්ථාන

අඳුරු ස්ථානවල සිටින යවනයන් බලාපොරොත්තුරහිත ක්‍රියාකාරකම් වල නිරත වීමට සිතිය හැක ණ්අපගේ සමීක්ෂණ වලින් පැහැදිලිව එළිදරව් කරගෙන තිබෙන ආකාරයට මානසික අවපීඩනය, අධික සංකාව, බීමත්කමට ඇබ්බැහි වී සිටීම, මාර්ගස්ථ හිරිහැර කිරීම් වලට ගොදුරු වීම, තම අනන්‍යතාවයේ වියකුලතා ඇතිවීම හා සමලිංගික ආකර්ෂණය අදිය තුළින් ගමන් කරන යවනයන් සියදිවි හානි කර ගැනීමේ ආකල්ප හා උත්සහ කිරීමට යොමු වීමේ දැඩි අවදානමක් පවතී.

## සියදිවි හානි කර ගැනීම පිළිබඳව දැඩි අවදානමක් ගෙනදෙන නිවැරදි කරුණු 7ක්





සියදිවි හානි කර ගැනීමේ සිතුවිලි සහ උත්සාහයන් පැමිණෙන විට එය පිටුවක තිබෙන ප්‍රතිශතයක් පමණක් නොව එය - සත්‍ය වශයෙන් සජීවී සිදුවීමකි. මෙම සංඛ්‍යා දත්ත හදවත් කඩාගෙන යෑමක් ගෙන දෙයි. සෑම කෙනෙකුම ජීවිතය ගැන කඩාවැටී ජීවිතය අවසන් කිරීමට යන්නාවූ යෞවනයෙකු නියෝජනය කරයි ණ්එහෙයින් අපි අන්ධකාරයට ආලෝකය ගෙන දිය යුතුය.

*"අන්ධකාරයෙහි හුන් සෙනග මහත් ආලෝකයක් දුටුවෝය. මරහුගේ දෙශයේහිද සෙවණේහිද හුන්නවුන්ට ආලෝකය උදා වුයේය." - මතෙව් 4:16*

## ගැහැණු ළමුන් වැඩියෙන් පීඩාවන්ට පත් වේ

කලාපිය සහ ආගමික වශයෙන් ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් අතර කරන ලද නිරීක්ෂණයන් අනුව ඔවුන්ගේ මානසික සෞඛ්‍යයේ ඉදිරි දැක්ම හා අනන්‍යතාවය පිළිබඳ දැඩි වෙනස්කම් පවතින අතර එය ගැහැණු තුල පිරිමි ළමුන්ට වඩා ඉහල මට්ටමක පවතී ණ්අවාසනාවකට, කැපවූ කිතුනුවන් තුලද මෙම කතාවෙහි වෙනසක් නැත ණ්සෑම කොටසකම ගැහණු ළමුන් සහ පිරිමි ළමුන් අතර ප්‍රමාණාත්මක පරතරයක් පැවතියද සමස්ථයක් ලෙස කැප වූ කිතුනුවන්ගේ අනුපාතය පහත වැටෙමින් පවතී.





## යෞවනයන් - කිතුනුවන් වුවත් - ලිංගිකත්වයේ නිරත වෙති

අප්‍රිකානු යෞවනයන් ලිංගික ක්‍රියාවන්හි නිරත වීම බොහෝ දුරට වැඩි වීමත් ආසියානු යෞවනයන්ගේ අඩු වීමත් වාර්තා වන අතර ගෝලීය වශයෙන් පසුගිය මස තුන තුළ **යෞවනයන්ගෙන් 10ට 3ක් ලිංගික ක්‍රියාවන්හි නිරත වන බව වාර්තා වේ.**

*මෙම ප්‍රශ්නය පිළිබද: ස්වයන් - වාර්තා කිරීමේදී යෞවනයන්ගේ ලිංගික ක්‍රියාකාරකම් පිළිබද අර්ථය නිර්වචනය කරන නමුත් ඔවුන්ගේ විහව හැසිරීම් පිළිබද වර්ණවත් කිරීමක් මෙමගින් ඉදිරිපත් කරයි. විවාහ වී ඇති බවට වාර්තා වූ යෞවනයන් මෙම දත්ත වලින් ඉවත් කර ඇති බව සනාථ කරන අතර විවාහයෙන් තොර ලිංගිකත්වය පමණක් නියෝජනය කරයි.*


## රටවල් අනුව ලිංගික ක්‍රියාකාරකම් වල යෙදීම




නව යෞවනයන්ට (18-19) සාපේක්ෂව වැඩිහිටි යෞවනයන් (13-15)ලිංගික ක්‍රියාවල නිරත වීම තුන් ගුණයකින් ඉහල මට්ටමක පවතී. කෙසේ වෙතත් මෑත කාලින වාර්තා අනුව අවුරුදු 16 න් පහළ යෞවනයන්ගෙන් 10න් 1කට වඩා වැඩි ප්‍රමාණයක් ලිංගික ක්‍රියා වල නිරත වන අතර සමහර අවස්ථාවල සමහර අවස්ථාවල තම අනන්‍යතාවය කිතුනුවන් ලෙස හදුනාගෙන ඇති පිරිස් අතරද මෙය ඉහළ අනුපාතයක් ගනී.


# වයස් සීමාවන්ට අනුව ලිංගික ක්‍රියාකාරකම් වල යෙදීම

මෙය අතපසු නොකරන්න.





# කිතුනු යෞවනයන්ගේ ප්‍රශ්න සහ පිළිතුරු


හරි හෝ වැරැද්ද ගැන නොසිතා යවනයන් ලිංගික ක්‍රියාකාරකම් වල නිරත වී සිටති. බයිබලයට අනුව ලිංගික ක්‍රියාකාරකම් වල යෙදීම විවාහකයින් සඳහා පමණක් වෙන් කර ඇති නමුත් සාමාන්‍ය යෞවනයන්ට වඩා කිතුනු යෞවනයන් ලිංගික ක්‍රියාකාරකම් වල නියෙලෙති.




මෙම ගැටලුව පිලිබඳව විවිධ සංස්කෘතින් විවිධ අදහස් දක්වයි.

# විවාහ වීමට පෙර ලිංගික ඇසුරු කිරීම් වල නිරතවීම ගැටලුවක් නැද්ද?




ඉහළම/අවම ධනාත්මක ප්‍රතිචාර

# කාමුක දර්ශන ව්‍යාප්ත වීම

යෞවනයන් ඔවුන්ගේ ලිංගිකත්වය පිළිබඳ විපරම් කරමින් සිටිති.


අඩකට ආසන්න (48%) යෞවනයන් කාමුක දර්ශන නරඹන බව පිළිගෙන ඇත.

පසුගිය මස 3 තුළ වාර්තාවන්ට ගැහැණු ළමුන්ට වඩා පිරිමි ළමුන් කාමුක දර්ශන අඩංගු දෑ බැලීමට යොමු වී ඇත (56% - 40%).

වැඩිහිටි යෞවනයන් නව යෞවනයන්ට වඩා කාමුක දර්ශන භාවිතා කරන නමුත් තවමත් අවම අනුපාතය 5 ට 2ක් වී තිබීම කම්පනයට පත් වන කාරණයකි!

48% යෞවනයන් කාමුක දර්ශන නරඹන බව පිළිගෙන ඇත.

## වයස් සීමා අනුව කාමුක දර්ශන වල භාවිතය.




## කිතුනු යෞවනයන්ගේ ප්‍රශ්න සහ පිළිතුරු



# නිගමනය

යෞවනයන්ගේ අත්විදින ප්‍රයෝගික සහ අවේගාත්මක පරීක්ෂාවන් සහ අරගලයන් ඉතා බිය ගෙනෙන සුළුය. ඔවුන්ගේ යථාර්තය පිළිබඳව දැනුවත් වී සිටීම මගින් ඔවුන් හා සංවේදී ලෙස ක්‍රියා කළ හැක.

- **කිතුනු යෞවනයන්ට ලිංගිකත්වය සම්බන්ධ ශේශ්‍රයේ ගොලත්වයක් අවශ්‍ය වේ.**
  අද දවසේ බොහෝ යෞවනයන් විවාහයේ තිබිය යුතු පවිත්‍ර සම්බන්ධතාවයෙන් වෙන්වෙමින් සිටි. කැපවූ කිතුනුවන් විවාහයට පෙර ලිංගිකත්වය වැරදි බව විශ්වාස කරමින් පැහැදිලි කරන නමුත් ඔවුන්ගේ චරිතය දඩුවමට පත් කිරීම තුලින් ඔවුන් පරීක්ෂාවට වැටීම නොවෙනස් වේ. යෞවනයන් හට බයිබලයේ ප්‍රකාශ කරන්නාවූ ඉගැන්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. ලිංගිකත්වය නම් ත්‍යාගයේ වටිනාකමක් ලෙස බයිබලිය දැක්ම තුලින් යෞවනයන්ගේ ජිවිත ක්‍රියාශීලිව දිරමත් කරන්නේ කෙසේද යන්න කියා අප සොයා ගත යුතුය.

- **කාමුක දර්ශන භාවිතය වර්තමාන පරම්පරාව තුල ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරයි.**
  යෞවනයන්ගේ වයස සහ හා අගමැ ඔවුන්ගේ ලිංගික හැගීම් සහ පෙලබවීම් වලින් ආරක්ෂා කරන බව අපට උපකල්පනය කල නොහැක. යේසුස් වහන්සේ සමග ගමන් කරන්නාවූ සහ නිරන්තරයෙන් ශුද්ධ ලියවිල්ල සමග නියැලී සිටින ටරුනයන් වුවත් මෙම ශේශ්‍රයේ අරගලයන් සමග පොරබදින බවට සංකයාත්මක එළිදරව් වීමක් තිබේ.

- **ගැහැණු ළමුන්ට අමතර සහයෝගයක් අවශ්‍ය වේ.**
  ගැහැණු ළමුන්ට පමණක් අවේනික වූ ඔවුන් මුහුණ දෙන්නාවූ ගැටළු සලක බැලීමේදී අප වැඩි වැඩියෙන් සිතීමට අවශ්‍ය වන්නේ ඔවුන් ආත්දකිම් බහුල ශක්තිමත් කාන්තාවන් කර තීතස් 2:3-5 සදහන් ආකාරයට ඔවුන් පසු පස සිටින්නාවූ අනුගාමිකයන් අතරද ඒ දෙය බෙදා ගනිමින් ඔවුන් ගොලත්වයට පත් කිරීම වේ.




# ඩිජිටල් තාක්ෂණය හරහා සම්බන්ධතා ගොඩනැගීම හා එහි බලපෑම

# අප සොයාගත් දේ



සාමානයෙන් යෞවනයන් දිනපතා **පැය 7යි විනාඩි 23** ක් පමණ මාර්ගස්ථ ජාලවල නියැලී සිටයි.





යෞවනයන්ගෙන් 94%ක් පවසන්නේ ඔවුන් සෑම **දවසකම වීඩියෝ දර්ශන නරඹන බවයි.**




**අන්තර්ජාලය වැඩි ලෙස** (10+දිනපතා පැය) භාවිතා කරන **යෞවනයන් වැඩියෙන් මානසික සෞඛ්‍ය සමග අරගල කරයිග**




යෞවනයන්ගෙන් බහුතරයක් **පවසන්නේ සමාජ මාධ්‍ය ජාලා ඔවුන්ගේ ජිවිත වලට තෘප්තියක් ගෙන දෙන බවයිග**

යෞවනයන්ගෙන් **64%** ක් දිනකට පයක් හෝ ඊට අඩුවෙන් **සමාජ මාධ්‍ය ජාලා භාවිතා කරතිග**



## කලාපයන් හා රටවල් අනුව තාක්ෂණික කාලය

වර්තමානයේ තාරුණ්‍යය සාමාන්‍යයෙන් නිතරම අන්තර්ජාලය ඔස්සේ සක්‍රියව කාලය ගත කරයි.





සමීක්ෂණයකට භාජනය කළ රටවල් 20ක් පුරාම සිටින යෞවනයන් දිනපතා සාමාන්‍යයෙන් පැය 7යි මිනිත්තු 23ක් අන්තර්ජාලයේ කාලය ගත කරයි. බ්‍රසිලයේ යෞවනයන් දිනපතා පැය 9.5 කට ආසන්න කාලයක් අන්තර්ජාලයේ සැරිසරන අතර චීනයේ දිනපතා අවම වශයෙන් පැය 5.5 කට ආසන්න කාලයක් අන්තර්ජාලය භාවිතා කරන බවට වාර්තා වේ.

| | රටවල් |
|---|---|
| 9:29 | බ්‍රසිලය |
| 9:07 | ඉන්දුනීසියාව |
| 8:29 | ආර්ජන්ටිනාව |
| 8:28 | නයිජීරියාව |
| 7:54 | රුසියාව |
| 7:40 | කෙන්යාව |
| 7:35 | එක්සත් ජනපදය |
| 7:34 | ඉන්දියාව |
| 7:22 | මෙක්සිකෝව |
| 7:22 | දකුණු අප්‍රිකාව |
| 7:19 | කොලොම්බියාව |
| 7:19 | බ්‍රිතාන්‍ය |
| 7:08 | පෘතුගාලය |
| 6:50 | වියට්නාමය |
| 6:45 | ස්පාඤ්ඤය |
| 6:43 | ඊජිප්තුව |
| 6:42 | නෙදර්ලන්තය |
| 6:29 | රුමේනියාව |
| 6:03 | ජපානය |
| 5:24 | චීනය |



## ගෝලීය ක්‍රියාකාර සමග කාලය ගතකිරීම




**වර්ගීකරණයට අනුව ඉහලම රටවල්**


| | |
|---|---|
| කේන්යාව | 3:45 |
| නයිජීරියාව | 4:00 |
| ඇමරිකා එක්සත් ජනපදය | 2:47 |
| ආජන්ටිනාව | 2:38 |

**94%** ක යෞවනයන් දිනපතා වීඩියෝ පටි නරඹති

සාමාන්‍යයෙන් සෑම යෞවනයෙකුම සාමාජ මධ්‍ය ජාලා භාවිතා කරයි. බොහෝ අය (64%) මේ සඳහා පැයකටත් අඩු කාලයක් ගත කරන අතර ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව විවිධ මත පළ කරයි.

- යෞවනයන්ගෙන් **5න් 3ක්** පවසා සිටින්නේ තම ජීවිතය පිළිබඳ තෘප්තිමත් හැඟීමක් ඇති කරගැනීමට සමාජ මාධ්‍ය ජාලා උපකාරී වන බවයි.
- **50% ක වඩා** යෞවනයන් පවසා සිටින්නේ මෙය ඔවුන්ව කනගාටුවට පත් කරන අතර ඔවුන්ව කාංසාවටත් විශාදයටත් පත් කරන බවයි.

## සමාජ මාධ්‍ය ජාලා කනගාටුව, කාංසාව හෝ විශාදය ඇති කරයි.




# තාක්ෂණික බලපෑම

අන්තර්ජාලය සක්‍රියව භාවිතා කිරීමේ පුරුදු පිළිබඳව තරුණ පරපුරෙන් විවිධාකාර ප්‍රතිචාර ලැබුනු බැවින් අප එම ප්‍රතිචාර වර්ගිකරණයකට ලක් කළේය. ඒ අනුව, (දිනපතා පැය 0 - 4 ක් සක්‍රිය විම) කෙටි කාලයක් අන්තර්ජාලය භාවිතා කරන්නන්, (දිනපතා පැය 4.1 - 9.9 ක් සක්‍රිය විම) මධ්‍යස්ථව අන්තර්ජාලය භාවිතා කරන්නන්, (දිනපතා පැය 10+ ක් සක්‍රිය විම) අධිකව අන්තර්ජාලය භාවිතා කරන්නන් ලෙසය.

කෙටි කාලයක් අන්තර්ජාලය භාවිතා කරන්නන් සහ අධිකව අන්තර්ජාලය භාවිතා කරන්නන් අතර තිබූ දෘශ්ටි කෝණ දෙවර්ගය ඉතා ආකාර්ෂණීය විය.

දත්තයන් වල ප්‍රවණතාවයන්ගෙන් පෙන්වන්නේ අධිකව අන්තර්ජාලය භාවිතා කරන්න තරුණයන් සමාජ සංස්කෘති විවේචනාත්මකව දැකිමට යොමු වි ඇති බවය. නිදසුන් වශයෙන්, අධිකව අන්තර්ජාලය භාවිතා කරන්න තරුණයන් විවහායන් වලට පෙර ලිංගික සබදතා ඇති කරගැනිම සහ ලිංගික අනන්‍යතාවයන් වෙනස් කරගැනිම වැරැද්දක් ලෙස නොදකිනු ඇත. මෙයට හේතුව ලෙස අධිකව අන්තර්ජාලය භාවිතා කරන්න තරුණයන් ලෝකය සහ විවිධ සංස්කෘතියන් වල පුළුල් දෘශ්ටි කෝණයකට නිරාවරණය විම විය හැකිය.

## අන්තර්ජාලය භාවිතා කරන්නන් හා ඔවුන්ගේ ජිවිත අත්දැකිම්




## අන්තර්ජාල භාවිතා කරන්නන් සහ පෞද්ගලික අභියෝගයන්

කෙටි කාලයක් අන්තර්ජාලය භාවිතා කරන්නන් *(දිනපතා පැය 0 - 4 ක් සක්‍රිය වීම)*

අධිකව අන්තර්ජාලය භාවිතා කරන්නන් *(දිනපතා පැය 10+ ක් සක්‍රිය වීම)*

*මාස 3ක සිට මාගේ අත්දැකීම*




අන්තර්ජාල සබැඳියාව සහ සැබෑ ජීවිතයේ අත්දැකීම් පිළිබඳ අනාවරණය කළ විට දත්ත පැහැදිලිවම පෙන්නුම් කරන්නේ අධිකව අන්තර්ජාලය භාවිතා කරන්නන් මානසික සෞඛ්‍ය අරගලයන්ට ගොදුරු වන බවය.

මෙම සොයා ගැනීම් තුලින් තරුණයන්ගේ අහිත කරන මානසික සෞඛ්‍යයට ප්‍රධාන ලෙස අධිකව අන්තර්ජාලය භාවිතා කිරීම බලපාන නමුත් බොහෝ තරුණයන් තම පෞද්ගලික අරගලයන්ගෙන් ඇති වන අහිතකරන මානසික ගැටලු වලින් පලා යැමට ඩිජිටල් උපාංග භාවිතා කරනු ඇත.

එසේම තරුණයන් තුල ඇති වන විවිධ හෝමෝන වෙනස්කම්, සමාජ පීඩාවන් සහ අනේකුත් අභියෝගයන් මොවුන් පෙර අත්දුටු නැති අලුත් අරගලයන් වන නිසා මෙවා දුරුවල මානසික දෘශ්ටි කෝණයකට මුලපිරිය හැක. එබැවින් වර්තමාන තරුණයන් ඩිජිටල් උපාංග සමග කාලය ගත කිරීමේ අරගලය, ඔවුන් මුහුණ දෙන සංකීර්ණ සංයෝජනයක එක් අංගයක් පමණක් වේ.


# නිගමනය

තරුණයන් අන්තර්ජාලයේ සක්‍රියව සිටින අතර අන්තර්ජාලය තරුණ පරපුරට බලපෑම් කරනු ඇත. මෙම කරුණු වලින් අපට අදහස් කරන්නේ කුමක්ද? ඒ සඳහා සලකා බැලිමට අදහස් කිහිපයක් මෙහි ඇත:

- **තරුණයන්ව අකාර්ෂණය කරවාගැනිමේ මධ්‍යයක් ලෙස විඩියෝ ඉතා ප්‍රබල දෘශ්‍ය සංජානන මාර්ගයක් වේ.**
  94% තරුණයන් දිනපතා විඩියෝ නැරඹීමට යොමු වන බව මතක තබා ගත යුතු ය. මෙම දෘශ්‍ය මධ්‍යය භාවිතා කරමින් තරුණයන් වෙතට යෙසුස් වහන්සේව හඳුන්වා දෙන්නේ කෙසේද?

- **තරුණයන් වෙතට ලගා විමට සමාජ මාධ්‍ය ජාලයන් ඉතා ඵලදායි ක්‍රමයක් වේ.**
  කෙසේ වෙතත් බොහෝ දෙනෙක් මෙම මාධ්‍යයන් තුල වැඩි කාලයක් ගත නොකරනු ඇත. (64% ක් දිනකට පැය 1ක් හෝ ඊට අඩු කාලයක් ගත කරයි.) එම නිසා සමාජ මාධ්‍ය ජලා තුල ඔවුන් ඔබ විසින් ඵල කරන කරුණු මග හැර නොයන පිණිස ඉතා පැහැදිලි හා ආකාර්ෂණිය විය යුතුය.

- **අධික කාලයක් අන්තර්ජාලය භාවිතා කරන්නේ පෞද්ගලික අරගලයන් වලට මුහුණ තරුණයන් විම වාසි දායක විය හැක.**
  මන්ද ඔවුන් තම පෞද්ගලික අරගලයන් සහ මානසික ගැටලු වලින් පෙලෙන්නන් විය හැක. එම නිසා එවැනි අවස්ථාවන් වලට සාකාච්ජා කළ යුතු කාරණා පිළිබඳ පෙර සුදානමක් තබා ගත යුතුය.




# අනන්‍යතාවන් සහ අන්තර් පුද්ගල සබඳතාවන්

# අප හඳුනාගත් කරුණු



තරුණයන්ගෙන් අඩකට පමණ ප්‍රමාණයක් විශ්වාස කරන්නේ **ස්ත්‍රී පුරුෂ භාවය මූලික වශයෙන් පදනම් වන්නේ පුද්ගලයෙකු උපතේ දී තම සතු වන ලිංගික අනන්‍යතාවය මතය.**




ඉතිරි ප්‍රමාණය විශ්වාස කරන්නේ ලිංගික අනන්‍යතාවය **පුද්ගලයාගේ පෞද්ගලික සිතුවිලි, හැඟීම් හෝ ලිංගික ආකර්ෂණයන් මත එම පුද්ගලයා විසින් තිරණය කරන බව ය.**






සාම්ප්‍රදායික විවහාය පිළිබඳව පිරිමි ළමුන්ට වඩා **ගැහැණු ළමුන්** තුල සංස්කෘතිය **මට්ටමට වඩා අඩු මට්ටමකි** මතයන් පවති.





ගෝලීය වශයෙන් තරුණයන්ගෙන් **48%ක්** විශ්වාස කරන්නේ **විවහාය පුරුෂයෙකු හා ස්ත්‍රියක් අතර පමණක් සිදු විමට නො අවශ්‍ය බවය.**



**1 දෙනෙකුගෙන් 10** අයෙක් **ශුද්ධවූ ලියවිලි මත** පදනම් වූ විවහාය මත තම විශ්වාසය දරයි.




**නව යොවුන් වියේ පසුවන 82%** ක් සමග ඔවුන්ගේ සබඳතා ගැන සෑහීමකට පත් වන අතර ඔවුන්ගේ **පවුල් අත්දැකීම් සමස්ථයක්** වශයෙන් යහපත් බව වාර්තා වී ඇති අතර එම සංඛ්‍යාවම පවසන්නේ **ඔවුන් හොඳින් දන්නා සමීප මිතුරන් සිටින බවයි.**

# තිරණ මත ලිංගික අනන්‍යතාවය

තරුණයන් තම ලිංගික අනන්‍යතාවය ගොඩනගා ගන්නා සංකීර්ණ ක්‍රමවේදය අපට තෙරුම් ගැනිමට අපහසු වුවත් ඔවුන් තමන් සහ අන් අය දෙස බලන ආකාරය මත අපට නිගමනයන් වලට එළඹිය හැක.


පොදුවේ ගත් කළ ස්ත්‍රී පුරුෂ භාවය පුද්ගලයෙකුගේ ලිංගිකත්වය මත තිරණය වේ. ගෝලිය වශයෙන් තරුණයන්ගේ මූලික මතය වන්නේ පුද්ගලයෙකුගේ ලිංගික අනන්‍යතාවය එම පුද්ගලයා උපන් ලිංගිකත්වය මත තිරණය වන බවය. නමුත් වර්තමාන තරුණයන්ගේන අඩක් පිලිගන්නේ ලිංගික අනන්‍යතාවය තමාගේ සිතුවිලි හා ආකාර්ෂණයන් මත වෙනස් කරගත හැකි තිරණයක් බවය.

## ලිංගික අනන්‍යතාවය මූලික වශයෙන් පදනම් වන්නේ





ලෝකයේ බොහෝ ස්ථානයන් වල මෙම මතය අඩු හෝ වැඩි වශයෙන් සාකච්ජාවට භාජනය වේ.

## කලාපයන් අනුව ලිංගික අනන්‍යතාවය



# ලිංගික අනන්‍යතාවය සහ වෙනස් කිරීම




බොහෝ තරුණයන්ගේ මතය නම් පුද්ගලයෙකු තම සිතුවිලි සහ හැඟීම් වෙනස් යැයි සිතනවා නම්, ඔවුන් ඒ පිලිබඳව තිරණයක් ගත යුතු බවය. ගෝලිය වශයෙන් 5න් 2ක් තරුණයන් පවසන්නේ පුද්ගලයෙකුගේ ලිංගික අනන්‍යතාවය මත තිරණය මත වෙනස් කර ගැනිම පිලිගත හැකි බවය. නමුත් කලාපයන් හා රටවල් අනුව මෙම මතයන් වෙනස් වේ.

- තරුණයන් ආගම් හෝ සදාචාරයන් මත සංවාද කිරීමට අකමැති වුවත් (7 වන පිටුව) ලිංගික අනන්‍යතාවය පිලිබද වෙනස් මතයන් දරයි.
- ගෝලිය වශයෙන් තරුණයන්ගෙන් 10% ක් පවසා සිටින්නේ පසුගිය මාස 3 තුල ඔවුන්ගේ ලිංගික අනන්‍යතාවය පිලිබද ව්‍යාකුල තත්වයක් ඇති වි ඇති බවය.
- 15% ක් පවසන්නේ තමා බොහෝ විට වෙනත් ලිංගික අනන්‍යතාවයක් දරණ බවය.
- පිරිමි ළමුන්ට වඩා ගැහැණු ළමුන් තම ලිංගික අනන්‍යතාවය සමග පොර බදින බව පවසා සිටිමට ඉදිරිපත් වේ. (12% එරෙහිව 9%)
- ගැහැණු ළමුන්ගේන් බහුතරයක් (59%) පවසා සිටින්නේ ලිංගික අනන්‍යතාවය තමන්ගේ හැඟීම් හෝ ආකාර්ෂණයන් මත තිරණය වන බවය. පිරිමි ළමුන් (42%) පවසන්නේ එසේමය.
- පුද්ගලයෙකු තම ලිංගික අනන්‍යතාවය වෙනස් කර ගැනිම වරදක් යැයි පැවසිමට ගැහැණු ළමුන් පිරිමි ළමුන්ට වඩා ඉදිරිපත් වනු ඇත. (52% එරෙහිව 32%)


# ආගමික භූමිකාව

ආගම තරුණයෙකුගේ ලිංගික අනන්‍යතාවය පිලිබඳ ඇති මතයට බලපෑමක් ඇති කරයි.

- ආගමික නොවන තරුණයෙකුගෙන් 63% ක් පවසා සිටින්නේ ලිංගික අනන්‍යතාවය පුද්ගලයෙකුගේ කැමැත්ත මත තිරණය වන බවය.
- මුස්ලිම් තරුණයන්ගෙන් 62% ක් පවසා සිටින්නේ එය පුද්ගලයෙකුගේ උපන් ලිංගිකත්වය මත තිරණය වන බවය.
- ක්‍රිස්තියානි තරුණයන්ගෙන් 50% ක් පවසා සිටින්නේ උපන් ලිංගිකත්වය මත තිරණය වන බවය.

කැප වූ කිතුනුවෙකු වීම තරුණයෙකුගේ ලිංගික අනන්‍යතාවය පිලිබඳ දරණ මතයට බලපෑම් කරයි.

## ක්‍රිස්තියානි තරුණයන්ගේ ප්‍රශ්ණ සහ පිළිතුරු




කිතුනු තරුණයන් සමලිංගිකත්වයට ආකාර්ෂණය බවක් නොදක්වයි.




## රටවල් අනුව සමලිංගික ආකාර්ෂණය2

**වැඩි වශයෙන්**

| | | |
|---|---|---|
| 1 | එක්සත් රාජධානිය | 29% |
| 2 | ආජන්ටිනාව | 29% |
| 3 | ඉන්දියාව | 29% |

**වැඩි වශයෙන්**

| | | |
|---|---|---|
| 1 | වියට්නාම් | 14% |
| 2 | ජපානය | 14% |
| 3 | ඉන්දුනීසියාව | 7% |


# සමලිංගික ආකාර්ෂණ සමග සබඳතා

ගැඹුරු සමීක්ෂණයකින් පසු වැදගත් දත්ත කිහිපයක්

- **ගැහැණු** ළමුන් පිරිමි ළමුන්ට වඩා දෙගුණයක් සමලිංගිකත්වයට යොමු වීමට කැමති වේ. (28% එරෙහිව 13%)
- **දුප්පත් පවුලක** ජීවත් වී අත්දැකීම් ලැබූ තරුණයන් පොහොත් පවුලක ජීවත් වී **අත්දැකීම්** ලබා ගැනීමට වඩා සමලිංගිකත්වයට ඇති ආකාර්ෂණය වැඩිවේ. (30% එදිරිව 18%)
- ආගමික පරිසරයක් නොමැති තරුණයන් හා සසඳන විට ඔනෑම **ආගමක්** අදහන තරුණයන් සමලිංගික ආකාර්ෂණයට ගොදුරු වීමට ඇති ඉඩකඩ අඩුය. (18% එදිරිව 25%)
- **මුස්ලිම් (13%) කැප වූ කිතුනුවන් (12%)** අතර ඉතා පහත මට්ටමක පවතී.

සමලිංගිකත්වය කලාතුරකින් තනි ගැටලුවක් ලෙස දකින්නට ලැබේ. මන්ද බොහෝ විට එය තවත් ගැටලු රාශියක් සමග දැකීමට ලැබේ.


## සමලිංගිකත්වය සමග බැඳුනු සාධක 4ක්



# පරිහානියට පත් වන විවාහය පිළිබඳ දැක්ම

## තරුණ විවාහයන්

විවාහය ජීවිත කාලය පුරාම සිදු කළ යුතු දෙයක් ද?





විවාහය සිදුවිය යුත්තේ පුරුෂන් හා ස්ත්‍රීන් අතර පමණනි?





**වෙනස් ලිංගික අනන්‍යතාවයන් අනුව**

"ඔව්" ලෙස පිළිතුරු සැපයීම





"නැත" ලෙස පිළිතුරු සැපයීම





අතපසු නොකර මෙය කියවන්න.

**රටවල් අනුව**




ඉහලම සහ අවම ඔව් ප්‍රතිචාරය




ඉහලම සහ අවම ඔව් ප්‍රතිචාරය

තරුණයන් විවාහයන් පිළිබඳව සම්ප්‍රදායික විශ්වාසයන් ප්‍රතික්ෂේප කරයි.

- **57%** විවාහය ජීවිත කාලය පුරාම තිබිය යුතු දෙයක් විශ්වාස කරයි.
- **27%** නිශ්චිත නැත.
- **16%** එකඟ නොවේ.

තරුණයන්ගෙන් අඩක් (48%) පවසන්නේ විවාහය ස්ත්‍රියෙකු සහ පුරුෂයෙකු අතර පමණක් සිදුවිය යුතු නොමැති බවත් (40%) අනිත් අය පවසන්නේ එය ස්ත්‍රියෙකු සහ පුරුෂයෙකු අතර පමණක් සිදුවිය යුතු බවය.


විවාහය පිළිබඳව ගැහැනු ළමුන්ගේ ආකාල්පය පිරිමි ළමුන්ට වඩා වෙනස් වේ. සමාන්‍යයෙන් ගැහැණු ළමුන් විවාහය ජීවිත කාලය පුරාම සිදු විය යුතු දෙයක් යැයි සිතිමේ ඉඩකඩ අඩු වන අතර (53% එදිරිව 61%) සහ විවාහය ස්ත්‍රියෙකු සහ පුරුෂයෙකු අතර පමණක් සිදුවිය යුතු නොමැති බව (58% එදිරිව 38%)

විවිධ සංස්කෘතීන් විවාහය පිළිබඳව විවිධ මත දරයි. නිදසුන් වශයෙන් ලතින් ඇමරිකාවේ තරුණයන්ට වඩා අප්‍රිකානු තරුණයන් විවාහය පිළිබඳ සම්ප්‍රදායික මතයන් දැරීමට වැඩි ඉඩකඩක් ඇත.

විවාහය පිළිබඳව බයිබලීය මතයන් දරන්නේ ඉතා සුළුතරයකි. විවාහය ස්ත්‍රී සහ පුරුෂයෙකු අතර පමණක් සිදු විය යුතු දෙයක් අතර එය ජීවිත කාලයම තිබිය යුතු බවත් ලිංගිකව හැසිරීම් විවාහ ජීවිතය තුල දී පමණක් සිදු විය යුතු යන මතයන් දරන්නේ තරුණයන්ගෙන් 1 ඩදබ 7 අයෙකු පමණි.

# මිත්‍රත්වයන් සහ පවුල් සබඳතාවයන්

අධ්‍යනයන්ගෙන් සොයා ගත් සතුටු දායක **ආරංචිය නම්!** තරුණයන්ගෙන් බහුතරයක් (82%) පවසන්නේ ඔවුන් තම මිතුරන් සහ පවුලේ ඇති සබඳතාවය පිළිබඳ සෑහීමකට පත් වන බවය.



57% ක් පමණ තරුණයන් තමන් දෙමාපියන් දෙදෙනාගේම රැකවරණය ලබන බව වාර්තා කරයි.



35% ක් වාර්තා කරන්නේ තමන් එක් දෙමාපියෙකු හෝ පවුලේ සාමාපියෙකු සමග ජිවත් වන බවයි.

අපගේ සමික්ෂණය වෙනස් කරමින් ඉන්දියානු සංඛ්‍යා ලේඛනය වාර්තා කරන්නේ **47% ක තරුණයන් එක් දෙමාපියෙකු සමග ජිවත් වන බවත් 20% ක් පමණක් දෙමාපියන් දෙදෙනෙකුගේ සෙනෙහස ලබන බවය.**

නමුත් අපගේ සමික්ෂණයට භාජනය වු රටවල් 20න් තම පවුල් අත්දැකිම් පිළිබදව වඩාත් තෘප්තිමත් වන්නේ 93% ඉන්දියානු තරුණයන් ය. මෙය ඉතා ආකාර්ෂණිය දත්ත වාර්තාවකි.

දෙමාපියන් සමග ඇති කරගන්නා වැදගත් සංවාද තරුණයන්ව තම පවුලට ඉතා සමිප කර ගැනිමට උපකාරයක් වනු ඇත.






ගෝලිය වශයෙන් 81% තරුණයන් පවසන්නේ තමන්ගේ වැදගත් යැයි සිතන අභියෝගයන් පිළිබදව තම දෙමාපියන් සමග සාකාච්ඡා කරන බවය.

එසේ නොකරන බව පවසන්නේ තරුණයන්ගෙන් 5න් 1ක් පුද්ගලයෙකු පමණි.

# උපරිමය සහ අවම





- **උපරිමය**: 63% ක් ඉන්දියානු තරුණයන් පවසන්නේ ඔවුන් තමන්ට වැදගත් අභියෝග ගැන තම දෙමාපියන් සමග සාකච්ඡා කරන බවය.
- **අවම**: ඇමරිකා එක්සත් ජනපදයේ තරුණයන්ගෙන් 10න් 3ක් පවසා සිටියේ ඔවුන්ගේ පවුලේ අත්දැකීම සමස්ථයක් ලෙස ගත් කල එතරම් යහපත් නැති බවය.

පවුල් පසුබිමට අමතරව තරුණයන් ඔවුන්ගේ ශක්තිමත් මිත්‍රත්වයන් පිළිබඳව අගය කරති.

තරුණයන්ගෙන් 82%ක් පවසා සිටින්නේ ඔවුන්ගේ ඥාතින් සමග සමීප සබඳතා ඇති බවය.

## රටවල් අනුව තරුණයන්ගෙන් මිත්‍රත්ව සබඳතා මට්ටම




තරුණයන් තම පවුල් සහ මිතුරන් සමග ඇති සබඳතාවයන් පිළිබඳ තෘප්තිමත් වේ නම්, ඔවුන් ආගම් හෝ ලිංගික අනන්‍යතාවයන් ගැන එතරම් සැලකිල්ලක් නොදක්වනු ඇත. තරුණයන් තම දෙමාපියන් සමග ධනාත්මක සබඳතාවයන් තිබුනත් නැතත්, ස්ත්‍රී පුරුෂ භාවයෙන් ද විවිධ ආගම් වල තරුණයන්ගෙන්ද සමීප මිතුරු සබඳතා පිළිබඳව ලැබු ප්‍රතිචාරයන් සමාන වේ.

# නිගමනයන්

තරුණ වියේ දි පෞරුෂත්වයන් මෙන්ම අන්තර් පුද්ගල සබඳතාවයන් සංකීර්ණ වනු ඇත. එනමුත් තරුණයන් තමන් පිළිබඳව සොයා ගැනිමට අතර හැර බලා සිටිය යුතු යැයි මෙයින් අදහස් නොකෙරේ. මන්ද ඔවුන් සමාජයේ කොටසක් වනු ඇත. එබැවින් මෙය ඇරඹුමට කරුණු කිහිපයක් මෙහි සඳහන් වේ.

- **වර්තමානයේ සිටින තරුණයන්ගෙන් අඩක් විශ්වාස කරන්නේ ලිංගික අනන්‍යතාවය පුද්ගලයෙකුගේ සිතුවිලි සහ ලිංගික ආකාර්ෂණයන් අනුව තමන් විසින්ම නිර්මාණය කරගත හැකි දෙයක් බවය.**
  මෙවැනි විශ්වාසයන් සහ අයිතින් ගැන කියන පසුබිමක සිටින තරුණයන්ට ලිංගික අනන්‍යතාවයන් පිළිබඳ බයිබලිය දැක්ම ඉදිරිපත් කරන්නේ කෙසේද?

- **වර්තමනයේ සිටින තරුණයන්, ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර පමණක් විවාහය සිදුවිය යුතු දෙයක් වන අතර විවාහය ජිවිත කාලය පුරා ඇති කරගත යුතු යන සම්ප්‍රදායි සංකල්පයෙන් ඈත් වි යන බව පෙනේ.**
  විවාහය පිළිබඳ දෙවියන් වහන්සේගේ සැලැස්ම පමණක් නොව ගිවිසුමක්, පොරොන්දු පිළිබඳව තරුණයන්ට අවබෝධයක් දි උපකාර කරන්නේ කෙසේද?

- **විවාහය පිළිබඳ බයිබලිය සංකල්පයන් ගැන ගැහැණු ළමුන් පිරිමි ළමුන්ට වඩා අඩු ආකාල්පයක් දරයි. එසේම ලිංගික අනන්‍යතා ගැටුලු වලට ගැහැණු ළමුන් වැඩියෙන් අරගල කරයි.**
  මෙවැනි ආකාල්පයන් ඇති ගැහැණු ළමුන්ට දෙවියන් වහන්සේගේ සත්‍යතාවයන් ගැඹුරින් වැටහිමක් කර ඔවුන්ට උපකාර කරන්නේ කෙසේද?

- **තරුණයන් ඔවුන්ගේ පවුල් සබඳතාවයන් පිළිබඳව තෘප්තිමත් වේ.**
  ඉන්දියානු තරුණයන් තමන් එක් දෙමාපියෙකු සමග ජිවත් වුවත් ඔවුන් තම පවුල් අත්දැකිම් පිළිබඳව වඩාත් තෘප්තිමත් වේ. මෙයින් පෙන්වා යන්නේ තරුණයන් තමන්ගේ ජිවිතයේ කුමන අරගලයකට හෝ අභියෝගයකට මුහුණ දුන්නත් තම පවුලට ආදරය කරන බවය.




# බලපෑම් සහ මාර්ග උපදෙස් දෙන හඬවල්

# අපි සොයා ගත් දත්තයන්

## ජීවිතයේ අරුත

තරුණයන් **පවසන්නේ** ජීවිතය යනු කුමක්ද සහ එහි අරුත වැනි වැදගත් ප්‍රශ්ණයන් වලට මාර්ග උපදෙස් ලබා ගන්නේ තම පවුලෙන් බවය.







## ලිංගික අනන්‍යතාවයන් සහ ලිංගිකත්වය

මෙම මතෘකාව සඳහා **සමාජ මාධ්‍ය සහ මිතුරන්** විශාල බලපෑමක් කරනු ඇත.

**ආගමික විශ්වාසයන්** වෙනස් කිරීමට ප්‍රධානම සහ ප්‍රථම සාධකය වන්නේ තමන්ගේ **පෞද්ගලික අත්දැකීම් බව තරුණයන් පවසයි.**



සම්ප්‍රදායික කිතුනු තරුණයන් පවසා සිටියේ **තමන්ගේ ආගමික විශ්වාසයන් වෙනස් කිරීමට ප්‍රථමික සාධකය** වුයේ තම දේවගැතිවරයාගේ ඉගැන්වීම් බවය.






**කැපවු කිතුනු තරුණයන්** තමන්ට උපදෙස් ලබා ගැනිමෙ දි තම දේවගැතිවරයා හෝ බයිබලය දෙසට හැරීම **සාමාන්‍ය කිතුනු තරුණයන්ට වඩා සිව් ගුණයක් වැඩිය.**

# තරුණයන් තම පවුල විශ්වාස කිරිම

## ජිවිතයේ අරුත යන සංවාදය



1. පවුලේ සමාජිකයන් 41%
2. සමාජ මාධ්‍යය 20%
3. මිතුරු මිතුරියන් 19%
4. ගුරුවරුන් / උපදේශකවරුන් 7%
5. අන්තර්ජාලයෙන් තොරව 7%
6. ආගමික නායකයින් / ආගමික ලියවිල 7%

## වැරදි සහ නිවැරදි යන සංවාදය



1. පවුලේ සමාජිකයන් 50%
2. මිතුරු මිතුරියන් 16%
3. සමාජ මාධ්‍යය 14%
4. ගුරුවරුන් / උපදේශකවරුන් 9%
5. ආගමික නායකයින් / ආගමික ලියවිලි 7%
6. අන්තර්ජාලයෙන් තොරව 5%


තරුණයන් දැඩි මතයන් දරණ නමුත් සමහර අවස්ථාවන් වල දී ඔවුන්ගේ අවිනිශ්චිත භාවය හේතුවෙන් තමන්ගේ නොවන වෙනත් කෙනෙකුගේ මතයන් දරණ බවක් පෙන්නුම් කෙරේ. සවිස්තරාත්මකව නොවුනත් වර්තමානයේ සිටින බොහෝ තරුණයන් මතයන් දරණ ආකාරයන් පිළිබදව අවබෝධයක් ලබා ගත හැකි වේ.

තරුණයන් පවසන්නේ ඔවුන් තමන්ගේ ජිවිතයේ වැදගත් තිරණයන් සහ ජිවිතයේ අරුත යන ප්‍රශ්ණයන් වලදී තම **පවුලේ උපදේස් ගැනිමට යොමු වන බවත් සමාජ මාධ්‍යය, මිතුරු මිතුරියන්, ගුරුවරුන්, උපදේශකවරුන්, ආගමික නායකයින්**, ආගමික ලියවිලි වැනි මාධ්‍යයන් වෙතට යොමු විමේ සම්භාවිතාවය ලැයිස්තුවේ අවම අගයන් ගනි.

පුද්ගලයෙකුගේ හැසිරිම තමන් ජිවිත අරමුණු සහ සදාචාරාත්මක සංකල්ප පිළිබද දරණ මතයන් අනුව තිරණය වේ. මෙම සංකල්පයන් දෙක ඕනෑම තරුණයෙකුගේ තිරණාත්මක ජිවිතයට වැදගත්වේ. තරුණයන් තමන් ලෝකය දෙස බලනා දෘශ්ටිකෝණය ස්ථාපිත කරන විට දී ඔවුන්ගේ උපදේශන විශ්වාසයන් ඔවුන්ගේ වැඩිහිටි භාවයටත් ගෙන යනු ඇත.

සදාචාරය සම්බන්ධව ගත් කල ලතින් ඇමරිකානු තරුණයන් වෙනත් රටවල් වල අයට වඩා තම පවුලේ උපදෙස් ලබා ගැනිමට යොමු වනු බව පෙනේ. මන්ද ඔවුන්ගෙන් 5න් 3ක් පවසන්නේ හරි වැරැද්ද සදහා ඔවුන් පවුලේ උපදෙස් ලබා ගැනිමට යොමු වන බවය. නමුත් සමස්ථයක් ලෙස ගත් කල අවම ලෙස ලැයිස්තු ගත වු රටවල් වල තරුණයන්ගේ ප්‍රතිචාර වුයේ උපදෙස් ගැනිමට පළමු පවුල බවය.


## රටවල් අනුව හරි වැරැද්ද සඳහා බලපෑමක් සිදු කිරීමට හැකියාවක් ඇති පවුල් සිටින තරුණයන්




තරුණයන්ගෙන් සෘණාත්මක පවුල් අත්දැකීම් ඇති රටවල් පවා තමන්ගේ මාර්ග උපදෙස් සඳහා තම පවුල වැදගත් ස්ථානයක් ගනි. නිදසුන් ලෙස එක්සත් ජනපදයේ තරුණයන්ගේ පවුල් අත්දැකීම් පිළිබඳව ශ්‍රේණිගත කිරීමේ දී පහළම ස්ථානය රට වුවත් සදාචාරාත්මක උපදෙස් (52%) හෝ ජීවිතයේ අරුත (42%) වන සංවාදයන් සඳහා ඔවුන් පවුල තෝරා ගනි. මෙයින් පෙන්වා යන්නේ අරගලකාරී ජීවන රටාවක් තුල ද තරුණයන් තම පවුලේ සාමාජිකයන් කෙරෙහි ඇති විශ්වාසය එලෙසම පවතින බවය.

ආගම් අනුව තරුණයන්ගේ උපදේශන බලපෑම් වෙනස් වනු ඇත. කිතුනු තරුණයන් ජීවිත අරුත වැනි වැදගත් මාතෘකාවන් සඳහා උපදෙස් ගැනීමේ දී අනිත් තරුණයන් මෙන් සමාජ මාධ්‍ය, මිතුරු මිතුරියන් වෙතට යොමු වනවාට වඩා තම පවුල වෙතට යොමු වන අතර 10 දෙනෙකුගෙන් 1 අයෙක් පවසන්නේ ඔවුන් තම දේවගැතිවරයා වෙතට හෝ බයිබලිය කියවීමට යොමු වන බවය.

## ජීවිත අරුත සඳහා ආගම් වලින් ඇති බලපෑම්




මෙය පිටපත් කිරීමේ දෝෂයක් නොවන අතර මෙහි ඇති වැදගත් බව හේතුවෙන් නැවතත් ඇතුළත් කර ඇත.

**ජීවිත අරුත යන ප්‍රධාන ප්‍රශ්ණය සඳහා දේවගැතිවරයෙකු වෙතට හෝ බයිබය වෙතට යොමු වන්නේ කිතුනු තරුණයන්ගෙන් 12න් 1ක් අයෙකු පමණි.**

මෙහි ඇති ගැඹුරත්වය ධාරණය කරමින් විනාඩියක කාලයක් වැය කර ජීවිතයේ අරුත පිළිබඳව වැරදි තැන් වලින් පිලිතුරු සොයනා තරුණයන් වෙනුවෙන් යාච්ඥා කරන්න.

# ලිංගික අනන්‍යතාවය සහ ලිංගිකත්වය යනු වෙනස් වූ සංවාදයකි.

## ලිංගික අනන්‍යතාවය සහ ලිංගිකත්වය යන සංවාදය




1. සමාජ මාධ්‍යය 36%
2. මිතුරු මිතුරියන් 23%
3. පවුලේ සමාජිකයන් 20%
4. ගුරුවරුන් / උපදේශකවරුන් 11%
5. අන්තර්ජාලයෙන් තොරව 6%
6. ආගමික නායකයින් / ආගමික ලියවිලි 4%

**ලිංගික අනන්‍යතාවය සහ ලිංගිකත්වය යන මාතෘකා පිළිබඳව තරුණයන් බොහෝ දෙනෙකු එනම් 3න් 1 අයෙකු තොරතුරු ලබා ගන්නේ සමාජ මාධ්‍යයෙන් බවය.** තරුණයන් බොහෝ විට මෙම මාතෘකා ගැන අන්තර්ජාලය තුලින් දත්තයන් සොයා ඉන්පසු එවා සම වයසේ තරුණයන් සමග හුවමාරු කර පසුව එවා සනාථ කරගැනිම සඳහා පවුලේ සාමාජිකයින් පසුව ආගමික නායකයින් හා ආගමික ලියවිල වෙතට පිළිවෙලින් යොමු වනු ඇත.

කිතුනුවන් අතර ද මෙවැනි මාතෘකා සඳහා සංස්කෘතිය සහ ප්‍රජාවන්ගේ මතයන් අනුව තිරණ ගන්නා බව දැකිමට සිදුවේ. මෙයින් පෙන්වා යන්නේ සමාජයේ අදහස් සභාවේ සහ ලියවිලි වල සංකල්පයන් වලට වඩා ඉහල තැනක් ගනු ඇත.

කෙසේ වෙතත් අපි සැලකිය යුතු වෙනස්කම් දකිමු. කැපවූ කිතුනුවන් එනම් කිතුනු විශ්වාසයන් දරණ බයිබලය කියවීමේ පුරුද්දක් ඇති සහ යාච්ඥා කරන තරුණයන් තම ආත්මික නායකයන් වෙතට සහ දේව වචනය වෙතට යොමු වනු ඇත. මෙවැනි තරුණයන් සාමාන්‍ය කිතුනු තරුණයන්ට වඩා තම ගැටලූ වලදී තම ආත්මික නායකයන් සහ දේව වචනය වෙතට යොමු වනවා යැයි පැවසිමට සිව් ගුණයක් වැඩිය.

**තොරතුරු සහ උපදෙස් සඳහා ආගමික නායකයන් සහ දේව වචනය වෙතට යොමුව...**




# තරුණයන්ගේ මනස වෙනස් කරනුයේ කුමක් විය හැකි ද?

විවිධ අදාර්ශමත් බලපෑම් යම් කිසි දුරකට තරුණයන්ගේ අදහස් සහ මතයන් වලට බලපෑම් කළත් අවසානයේ දි ස්වාධීන පුද්ගලයා තම මතයන් සහ විශ්වාසයන් පිළිබඳව ශක්තිමත තිරණයන් ගැනීමට සිදු වනු ඇත.

තරුණයෙකුගේ ආගම් සහ විශ්වාසයන් කෙරෙහි ඇති විශ්වාසය වෙනස් කිරීමට කුමක් සිදුවිය හැකිද යන්න අප සොයා බැලියය යුතුය. බොහෝ දෙනෙකුගේ පෞද්ගලික අත්දැකිම එනම් යාච්ඤාවට පිළිතුරු ලැබිම වැනි අත්දැකිම් ඔවුන්ගේ මතයන් වෙනස් කිරීමට ප්‍රබල බලපෑමක් වි ඇත.

**ආගමික විශ්වාසයන් පිළිබඳව මනස වෙනස් කරගැනීමට කුමක් කළ යුතු ද?**


1. යාච්ඤාවන් වලට පිළිතුරු ලැබිම වැනි පෞද්ගලික අත්දැකිම් 37%
2. අන්තර්ජාල ඔස්සේ හෝ පොත්පත් හරහා සිදු කල මාගේ ගවේශනයන් මගින් 26%
3. මාගේ දෙමාපියන් සමග කළ සංවාදයක් 18%
4. ආගමික නායකයින්ගේ ඉගැන්විම් මගින් 12%
5. මිතුරෙකු සමග කරනා සංවාදයක් 8%

මෙම සමීක්ෂණය තුළ දී නැවත වරක් ඉන්දියානු තරුණයන් ගණනයන් වෙනස් කරමින් පවසන්නේ ආගමික විශ්වාසයන් පිළිබදව මනස වෙනස් කරගැනිමට ප්‍රධාන බලපෑම තම පවුල (46%) බවත් තම පෞද්ගලික අත්දැකිම් (15%) ලැයිස්තුවේ අවසාන වල හමුවේ.

අන්තවාදි තරුණයන් තම ගවේශණයන් කෙරෙහි දැඩි ලෙස විශ්වාසය දැරුවත් ඔවුන් වුවද පෞද්ගලික අත් දැකිමකින් වෙනස් වනු ඇත. කිතුනු තරුණයන්ද වෙනත් ආගමික තරුණයන් මෙන් තම පෞද්ගලික අත්දැකිම් තුලින් වෙනස් වන බව පිළිගනි. අනිත් ආගම් වලට වඩා මුස්ලිම් ආගමික තරුණයන් තම පෞද්ගලික අත්දැකිම් වලට වඩා ආගමික නායකයන්ගේ ඉගැන්විම් මත විශ්වාස කිරිම.

**[*]ලැයිස්තුවේ විශාලතම ආගම වන්නේ මුස්ලිම් ආගම වේ*

## ආගම පිළිබදව තම මතයන් වෙනස් කිරිමට ඉක්මන් වන අය වන්නේ



# නිගමනයන්

තරුණයන් තමන්ගේ මාර්ග උපදේශනයන් සහ ජිවිතයන්ට අදාර්ශමත් බලපෑම් කරන අය පිළිබද වාර්ථාවක් ඉදිරිපත් කර තිබේ. අපගේ අවධානය යොමු වි ඇති නම්, මෙන්න ඔවුන්ගේ ප්‍රතිචාරයන් කිහිපයක්

- **ජිවිතයේ වැදගත් ප්‍රශ්ණ අභියෝග සදහා උපදෙස් ගැනිමට තම පවුල ප්‍රථම ස්ථානය ගනු ලැබේ.**
  දෙමාපියන් වශයෙන් තම තරුණයන්ගේ ජිවිතය පිළිබදව ලැබි ඇති වගකිම සුළු නොකළ යුතු ය.

- **ලිංගික අනන්‍යතාවය සහ ලිංගිකත්වය යන සංකල්පය තුල දී සභාව සහ දේව වචනය අවම මට්ටමක පවති.**
  සංස්කෘතිය - සමාජ මාධ්‍යයන් සහ මිතුරන් අතරෙ ප්‍රධාන මාතෘකා පිළිබදව ඉතා වේගයෙන් සහ පුළුල් ව්‍යාප්තයක් සදහා ප්‍රබල මාධ්‍යයක් වි ඇත. නමුත් මෙවැනි මාධ්‍යයක් තුල දි දේව පණිවිඩය යැවිම සදහා කිතුනු නායකයින් ලෙස අප ක්‍රියා කළ යුතු ආකාරය කුමක් විය යුතු ද?

- **තරුණයන්ගේ ප්‍රබල බලපෑම වන්නේ තම පෞද්ගලික අත්දැකිම් වේ.**
  දැනටමත් දෙවියන් වහන්සේ තුල කැපවි සිටින තරුණයන් උන්වහන්සේ තුල තවත් ඇදහිල්ල වර්ධනය කර ගැනිම සදහා තවත් පෞද්ගලික අත්දැකිම් සොයන අතර අනිත් තරුණයන් වුවත් පෞද්ගලික අත්දැකිමකින් තම මතයන් වෙනස් කරගැනිමට ඉදිරිපත් වනු ඇත. එවැනි අත්දැකිමක් ලබා ගැනිමට උපකාර කළ හැකි ආකාරයන් මොනවාද?



## රොබට් හොස්කින්ස්ගෙන් ලිපියක්

# *අපගේ අවධානය යොමු කරනවාද?*

මෙම පරීක්ෂණය හේතුවෙන් වර්ථමානයේ සිටින තරුණයන්ගේ ජීවිත මතයන් වලට ප්‍රබල බලපෑමක් ඇති කරන්නේ කුමක්ද යන්න අපට දැනගත හැකි වේ. සත්‍යතාවයෙන් බැහැර වු සංස්කෘතියක් තුල දේව භක්තිවන්ත පරපුරක් නිර්මාණය කිරීම කළ නොහැකි නමුත් අපි අදහාන දෙවිදුන් කළ නොහැක යැයි පවසන දෙවි කෙනෙකු නොවේ.

එසේම අප මතක තබා ගත යුතු වැදගත් කරුණ වන්නේ අපගේ කාලවකවානු වල දී මෙවැනි සංකීර්ණ දේවල් මුහුණ දීමට සිදු නොවුනත් ජීවිතයේ ඔවුන් මුහුණ දෙන සංකීර්ණ දෑ පිළිබඳව මෙම වාර්ථාව තුලින් අවබෝධයක් ලබා ගත හැකිය.

මෙම වාර්ථා වලින් තරුණයන් ලිංගික අනන්‍යතාවය සහ ලිංගිකත්වය වැනි ගැඹුරු මාතෘකා පිළිබඳව උපදේශනයන් බලාපෙරොත්තු වන බවට පෙනී යයි. පෞද්ගලික අරගලයන් නිසා තරුණයන් අතරෙ ඇති වන සිව්දිවි හානිකර ගැනිමේ වාර්ථාවීම් තරුණයන් උපකාර ඉල්ලීමක් ලෙස දැකිය හැකි වේ. මෙවැනි ව්‍යයසනකාරී අවස්ථාවක වුවත් ඔබගේ බලාපොරොත්තු නැති නොකරගන්න. මන්ද සුභ ආරංචිය නම් තරුණයන් තම විශ්වාසවන්ත උපදේශනයන් ලබා ගන්නේ තම පවුලෙන් වන බවයි.

අවාසනාවකට වර්ථමානයේ තරුණයන් තමා පිළිබඳවත් තමන්ගේ ජීවිතයේ අරමුණත් පිළිබඳව දැන ගැනිම සඳහා දේව වචනය සහ දේවගැතිවරුන් වෙතට යොමු වනවා වෙනුවට ඔවුන් අන්තර්ජාලය තුලින් පිළිතුරු සොයා ගැනිමට යොමු වනු ඇත. මෙම සැකයන් අලුත් දෙයක් නොවන අතර එදා තෝමස් සැක කළ ආකාරයට සමාන වනු ඇත. යොහාන් 14:5-6 ජීවිතයේ වැදගත් ප්‍රශ්ණයක් වන “මාර්ගය දැන ගන්නේ කෙසේද?”

වර්තමාන තරුණයන් ලෝකය දෙස බැලීමට පටු දෘශ්ටි කෝණයකින් උත්සහා කරන අපගේ යුතුකම ලෙස ඔවුන්ව සත්‍යතාවය තුලින් දැනුවත් කළ යුතුය. තෝමස්ගේ කාලයේ මෙන්ම මොවුන්ගේ සැකයන්, ගැටලු සඳහා අප ඔවුන්ව යේසුස් වහන්සේගේ පිළිතුරු වෙතට යොමු කළ යුතුය:

## “මාර්ගය නම් මම වෙමි”

## වන් හෝප් ආයතනය පිලිබදව

ලොව පුරා තිබෙන සභාවන්, අමාත්‍යාංශ සහ අණ්ඩු සමග සහායෝගයෙන් වන් හෝප් ආයතනය බිලියන 1.6 කට වැඩි සංඛ්‍යාවක් ළමුන් හා තරුණයන් වෙතට දේව වචනය සමග ලගා වි ඇත. වන් හෝප් ආයතනය පැවැත්වූ දේශිය සමික්ෂණයන් පදනම්ව ශුද්ධ ලියවිලි පාඨමාලා සැලසුම් කර ඇත්තේ වයස සහ සංස්කෘතික වශයෙන් වැදගත් වන පරිදිය. වසර 1987 සිට සෑම රටකම සිටින ළමුන් සහ තරුණයන් සමග ජිවිත වෙනස් කරන්නාවූ දෙවියන්වහන්සේගේ සුභරාංචිය බෙදා ගෙන ඇත. වැඩි දුර දැනගැනිම සඳහා දබැයදවැගබැළ අඩවියට පිවිසෙන්න.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනයෙන් රටවල් 20ක වයස අවු 13-19 දක්වා තරුණයන් 8394ක් සමික්ෂණයට භාජනය කෙරුණි. සෑම රටකම ආසන්න වශයෙන් තරුණයන් 400ක් නියෝජනය කරගත්තේය. සංඛ්‍යාවක් ළමුන් 95% හා තරුණයන් වෙතට දේව වචනය සමග 5% ලගා වි ඇත. වන් හෝප් ආයතනය 13 පැවැත්වූ දේශිය සමික්ෂණයන් 19, පදනම්ව ශුද්ධ ලියවිලි පාඨමාලා සැලසුම් කර ඇත්තේ වයස සහ සංස්කෘතික වශයෙන් වැදගත

රටවල් 5ක් (චිනය, ඊජිප්තුව, ඉන්දියාව, ජපානය සහ වියට්නාමය) ආගමික පදනමක් මත විශ්ලේෂණයක් කිරිමට අර්ථවත් දත්ත ප්‍රමාණයක් ලබා ගැනිමට හැකි විය. එනම් 10%ක් ක්‍රිස්තියානි තරුණයන් බවට වාර්තා විය. නමුත් වෙනත් රටවල් වල කිතුනු මුස්ලිම් සඳහා අවම වශයෙන් 10% යන ඉලක්කය කර ගත් නියැදියකින් දත්ත් රැස්කර ගත්තේය. එසේම කෙන්යාවේ 40% ක් කාන්තාවන් විය යුතු යන නියැදියක් ද මෙහි දි භාවිතා කරන ලදි.

මෙහිදි ප්‍රශ්ණ වලට පිලිතුරු දුන් ප්‍රතිචාර වැරදි නම් එවා ඉවත් කළ අතර මෙම සමික්ෂණය ප්‍රශ්ණ 70කින් සමන්විත වේ. නිසාත් නිරෝධානයන් සහ නිවස් අඩස්සියේ සිරවි සිටිමට සිදු නොවුනු නිසාත් විශාදය, කාංසාව වැනි මානසික පිඩාවන් මෙම සමික්ෂණයට භාජනය නොවු බැවින් තරුණයන්ගේ සත්‍ය හැගිම් සහ මතයන් අපට ලැබිමට හැකි වුනු බව අප විශ්වාස කරමු.

# දත්ත රැස්කිරීම

මෙම සමීක්ෂණය සඳහා දත්ත රැස් කරනු ලැබුවේ 2020, පෙබරවාරි මස 24 සිට මාර්තු මස 27 දක්වා වේ. මෙම කාලය තුල දී තරුණයන් කොරෝනා වසංගතය හේතුවෙන් පීඩා නොවින්ද නිසාත් නිරෝධානයන් සහ නිවස් අඩස්සියේ සිරවී සිටිමට සිදු නොවුනු නිසාත් විශාදය, කාංසාව වැනි මානසික පීඩාවන් මෙම සමීක්ෂණයට භාජනය නොවු බැවින් තරුණයන්ගේ සත්‍ය හැගිම් සහ මතයන් අපට ලැබිමට හැකි වුනු බව අප විශ්වාස කරමු. එසේම චිනයේ දත්තයන් කොරොනා - 19 වසංගතය හේතුවෙන් ජාතික පෙර රැස් කරන ලදි.

| රටවල් | දත්ත රැස් කිරීමේ දින |
|---|---|
| ආජන්ටිනාව | පෙබරවාරි 27 - මාර්තු 2, 2020 |
| බ්‍රසිලය | පෙබරවාරි 27 - මාර්තු 11, 2020 |
| චිනය | පෙබරවාරි 27 - මාර්තු 6, 2020 |
| කොලොම්බියාව | පෙබරවාරි 27 - මාර්තු 2, 2020 |
| ඊජිප්තුව | පෙබරවාරි 27 - මාර්තු 9, 2020 |
| ඉන්දියාව | පෙබරවාරි 28 - මාර්තු 17, 2020 |
| ඉන්දුනිසියාව | පෙබරවාරි 27 - මාර්තු 7, 2020 |
| ජපානය | පෙබරවාරි 27 - මාර්තු 23, 2020 |
| කෙන්යාව | පෙබරවාරි 25 - මාර්තු 27, 2020 |
| මැක්සකෝව | පෙබරවාරි 27 - මාර්තු 2, 2020 |
| නේදර්ලන්තය | පෙබරවාරි 27 - මාර්තු 8, 2020 |
| නයිජිරියාව | පෙබරවාරි 24 - මාර්තු 20, 2020 |
| පෘතුගාලය | මාර්තු 7 - මාර්තු 20, 2020 |
| රෝමය | පෙබරවාරි 28 - මාර්තු 13, 2020 |
| රුසියාව | පෙබරවාරි 27 - මාර්තු 2, 2020 |
| දකුණු අප්‍රිකාව | පෙබරවාරි 24 - මාර්තු 7, 2020 |
| ස්පාඤ්ඤය | මාර්තු 7 - මාර්තු 13, 2020 |
| එක්සත් රාජ්‍යය | පෙබරවාරි 24 - මාර්තු 3, 2020 |
| එක්සත් ජනපදය | පෙබරවාරි 24 - පෙබරවාරි 29, 2020 |
| වියට්නාමය | මාර්තු 13 - මාර්තු 26, 2020 |

# නිර්වචනයන්

### කැපවූ කිතුනුවන්

යෙහෙවා සාක්ෂිකරුවන් හෝ මොර්මොන් නොවන කිතුනු තරුණයන් එනම් පහත අංගයන්ගෙන් සමන්විත වුවන්:

- දෙවියන් වහන්සේ ජීවමාන බව විශ්වාස කර උන්වහන්සේ සමග පෞද්ගලික සබඳතාවයක් ගොඩ නගා ගැනීමට හැකි බව විශ්වාස කරන අය.
- යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව විශ්වාස කරන අය.
- පාපයන් වලට සමාව ලබා ගත හැක්කේ ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුලින් පමණක් බව විශ්වාස කරන අය.
- ශුද්ධවූ බයිබලය දේව වචනය බව විශ්වාස කරන අය.
- පසු ගිය සතිය තුල තමන් විසින්ම බයිබලය කියවා ඇති අය.
- දිනපතා හෝ සතිපතා යාච්ඤා කරන අය.

කැපවූ කිතුනුවන් යනු කතෝලික, හත්වන දින ඇඩ්වෙන්ටිස්, ඕත්ඩෝක්ස් හෝ වෙනත් කිතුනු නිකායන් විය හැක.

### සාමාන්‍ය කිතුනුවන්

යෙහෙවා සාක්ෂිකරුවන් හෝ මොර්මොන් නොවන සහ ඉහත ඇති අංගයන් ඇති විශ්වාසයන් පුරුදු නොමැති නාමකික කිතුනුවන් වේ.

### වෙනත් ආගම්

බෞද්ධ, හින්දු, ජුදෙව්, මුස්ලිම් වැනි වෙනත් ආගමික මතයන් දරණ තරුණයන්.

### අදේවවාදීන්

ඉහත කිසිවකටත් සම්බන්ධ නොවී දෙවි කෙනෙකු නැත යන මතයෙන් ජීවත් වන තරුණයන් වේ.

## ගැටලු

මෙම සමීක්ෂණය පිළිබඳව ඇති ගැටලු විමසීම සඳහා research@hopeeducation.org හා සම්බන්ධ විය හැක.

OneHope
God's Word. Every Child.

Global Youth Culture, Global Report
ISBN 978-1-64653-275-9
Copyright © 2021 by OneHope, Inc.
600 SW Third Street Pompano, FL 33060
onehope.net

Scripture quotations are from the New Revised Sinhala Version (NRSV) 3rd Edition 2006. Printed by Ceylon Bible Society. Used by permission. All rights reserved.



# තාරුණ්‍යයේ
## ගෝලීය සංස්කෘතිය

OneHope, Inc | 600 SW 3rd St. Pompano Beach, FL 33060 | 1-800-448-2425 | onehope.net